ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

" ස්වාමීන් වහන්සේ උතුම්ය. බොහෝ සෙයින් ප්‍රශංසා ලැබිය යුතුය. උන්වහන්සේගේ උතුම්කමද, සොයා දැනගත නොහැකිය. (ගීතාවලිය 145:3)

76 වන වෙළුම අංක 03 (903) 2017 මාර්තු

මම ඔවුන් අතරේ මනුෂ්‍යයෙකුව සෙවිම්...

කාටර් කොන්ලන් විසිනි

ඊශ්‍රායෙල් සෙනගගේ පිරිහීයාමේ පැය පැමිණ තිබූ විට දෙවියන් වහන්සේ සමග ගමන් කිරීමට සහ ජාතියක් වශයෙන් දෙවියන් වහන්සේව අවබෝධ කරගැනීම ඉල්ලා සිටින බව එසකියෙල් පොතේ සඳහන් වන්නේ ය. සැබවින්ම දෙවියන් වහන්සේ ඔවුන්ට පිළියෙල කරදුන්නාවූ තත්වයෙන් ඔවුන් කනගාටුදායක ලෙස පහතට වැටී තිබුණි. සෙනග පව්කරනවිට දෙවියන් වහන්සේගේ හස්තයේ ආරක්ෂාව අහිමිවී ගොස් ජාතියක් වශයෙන් තමන්ගේම හැසිරීමේ ප්‍රතිඵලයේ ප්‍රකාරයට විනාශය කරා ගමන්කිරීම ඉතිහාසයේදී සෑමවිටම පෙනෙන්නට තිබෙන ලක්ෂණයයි. පහතින් සඳහන් වන්නාවූ බයිබල්පද වලින් එය පැහැදිලිවේ.

"ස්වාමීන් වහන්සේගේ වචනය මා වෙතට පැමිණ කියනුයේ මනුෂ්‍ය පුත්‍රය ඇට මෙසේ කියාපන්න. නුඹ වනාහී පවිත්‍ර නුණාවූ උදහස් දවසේදී වැසි නොලබන්නාවූ දේශයක්ය. ඇගේ ප්‍රෝපේත වරුන්ගේ දෝහිකමක් අද තුළ ඇත්තේය. ඔවුහු ගොදුර ඉරන්නාවූ ගෝරවන සිංහයෙකු මෙන් ප්‍රාණ කා දැමුවෝය. ඔවුහු වස්තු සහ අනර්ඝ දේ ගනිති. ඔවුහු එහි තුළ වැන්දඹුවන් වැඩි කළෝය." (එසකියෙල් 22 : 23-25)

අපේක්ෂිත ආකාරයටම අනාගතවකතෘවරු නැගිට ධරමිශ්ඨ ජීවිත ගතකිරීම ජාතියක් ලෙස ආරම්භ කිරීමට අනාගතවක්‍යය පවසමින් පම්ණෙන්නට තිබෙන්නේ මොනවාදැයි අනතුරු අඟවනවිට ඔවුන් දෙවියන් වහන්සේ වෙතට නැවත හැරී ඒමට ක්‍රියා නොකරන්නේ නම් ස්ථිර වශයෙන්ම අනාගතවකතෘ තුලින් අනතුරු ඇඟෙව්වාවූ කාරණා ක්‍රමාණුකූලව සිදුවීම ප්‍රකාශ වන්නේය. ඒ අතරම මේ හේතුව නිසා අනාගතවකතෘවරු ඊශ්‍රායෙල් සෙනග කරන්නාවූ දේවල් සමග එකඟතාවයකට එළඹෙන්නෝය. කලින් අනර්ඝවූ කාරණා පැවසූවාවූ අනාගතවකතෘවරු දැන් දෙවියන් වහන්සේගේ වස්තුව වන සෙනගව කොල්ලකනු ලබන්නෝය.

එසකියෙල් අනාගතවකතෘගේ කාලය වන විට එම පරම්පරාව තුල මෙය සිදුවෙමින් පැවතියේය. **"ඔවුහු එහි වැන්දඹුවන් වැඩිකළෝය."** මෙහි අදහස පවුල් ජීවිත බිඳදමා වෙන්කරනු ලැබීමයි. ඊශ්‍රායෙල් සෙනගගේ පැවැත්මේ ශක්තිය ජාතියක් වශයෙන් විනාශ කරදැමුවෝය.

"ඇගේ පුජකයෝ මාගේ ව්‍යවස්ථාව කඩකොට මාගේ ශුද්ධවූ දේ කෙලහුවෝය. ඔවුන් ශුද්ධ එකද අශුද්ධ එකද අතරේ වෙනසක් කළේවත්, අපවිත්‍ර එකද, පවිත්‍ර එකද අතරේ තිබෙන වෙනස දැන්නුවේවත් නැත. මාගේ සඛත්ද ඔවුහු නොසලකා හැරියෝය. මෙසේ ඔවුන් අතරේ මට අගෞරව පැමුණුණේ ය." (එසකියෙල් 22 : 26) **"ඇගේ ප්‍රොපේතවරුද ප්‍රයෝග දර්ශන දැක ඔවුන්ට බොරු පේන කියා, ස්වාමීන් වහන්සේ කථා නොකළ නමුත් ස්වාමිවූ දෙවියන් වහන්සේ මෙසේ කියනසේකැයි කියා පදවි නොකළ බදාම ගැසෝය."** (එසකියෙල් 22 : 28)

දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ, ගෞරවණිය කාරණා සහ අපවිත්‍ර දේ අතර වෙනස පැහැදිලිකර දුන්නේ නැත. අයුතුලෙස ලාභ (බලය) ලබාගන්න පිණිස සෙනග අසන්නට කැමති මොනවාද ඒවා අනාගතවකතෘවරු පැවසුවෝය. එමනිසා සෙනග ඔවුන්ගේ ගෞරවණිය තත්වයට හැරි ඒමෙන් බොහෝ සේ ඈත්ව ගියෝය. අනාගතවකතෘවරු ඔවුන් පැවසිය යුතු සත්‍යතාවය ගැන හෝ කිසිවෙකුගේ පාලනයට යටත් නොවී විවෘතව අවධාරණය කර සිටිය යුතුදේ ප්‍රකාශ නොකළෝය. දෙවියන් වහන්සේ ඔවුන්ට කථා නොකළවිට, **"දෙවියන් වහන්සේ මෙසේ පවසන සේකැයි"** ඔවුන් පැවසුවෝය.

"දේශයේ සෙනග බලාත්කාරකම් කොට කොල්ලකෑවෝය. අසරණයාටද, දිළින්දාටද පීඩාකොට, අයුතු ලෙස විදේශියාට බලාත්කාර කළෝය." (එසකියෙල් 22 : 29) මෙහිදී ඊශ්‍රායෙල් ජාතියේ බිඳවැටීම අපි දකින්නෙමු. ආත්මිකව, සමාජීය වශයෙන් සහ සදාචාරාත්මකව ඔවුන් සම්පූර්ණයෙන්ම පිරිහීමට ලක්වුවෝය. එබැවින් ඊශ්‍රායෙල් සෙනග විනිශ්චය අනාවරණයවීමට ආසන්න මොහොතක සිටියෝය.

වර්තමානයේ අපගේ දේශයේ තුලත් පවතින්නාවූ තත්වය අපි අවබෝධ කරගත යුතුය. නපුර යහපත වශයෙනුත්, යහපත නපුර වශයෙනුත්, පිළිගැනීම අපි ඉක්මනින් වැළැක්විය යුතුය. අපිත් පිඩාවට ලක්වීමට යොමුවී කොල්ලකෑමේ යෙදී සිටිනවා වියහැකිය. පවුල් සංස්ථාවේ පැවැත්ම අපේ දෑස් ඉදිරියේම විනාශ වෙමින් පවතිනවා දැකිය හැකිය. ලොව වටා සමාජයන් තුල පවුල් සංස්ථාව පිරිහීමට (විනාශයට) ලක්වී තිබෙන බව සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව අධ්‍යනය කරන්නාවූ ඕනෑම කෙනෙකුට අවබෝධ කරගත හැකිය.

විනිශ්චයට ඉහළින් කරුණාවේ ජයග්‍රහණය තවමත් පවතින්නේය.

සමාජයේ සියළුම තරාතිරම්වලට බලපාන ලෙස අනාචාරයේ නිරතවීමට ඔවුන් ඉඩහැර තිබුණා වුවත් ඒ අතරම ස්වාමින්වහන්සේගේ විනිශ්චය තේරුම්ගැනීමට පැහැදිලිවම ඉල්ලාසිටිනසේක. කෙසේවෙතත් අපි අවධානය යොමුකරන්නාවූ එසකියෙල් පොතේ බයිබල් ඡේදය තුල අපේ ප්‍රතිචාරය නොකඩවා උන්වහන්සේ බලසිටිනසේක.

"මා විසින් දේශයේ නාස්ති නොකරන පිණිස පවුරක් ගොඩනඟා දේශයේ උදෙසා මා ඉදිරිපිට කඩුල්ලෙහි සිටීමට ඔවුන් අතරේ මනුෂ්‍යයෙකු සෙවිම්. නමුත් කිසිවෙක් වට සවිඩිණුනේය. එබැවින් මාගේ කෝපය ඔවුන් කෙරෙහි වගුරුවා මාගේ උදහස් ගින්නෙන් ඔවුන් නාස්තිකාර දමා ඔවුන්ගේ මාර්ගය ඔවුන්ගේ හිස්පිටට පැමිණ වීමයි ස්වාමීන් වහන්සේ කියන සේකැයි කීය." (එසකියෙල් 22 : 30-31)

"ඔවුන් අතරේ මනුෂ්‍යයෙකු සෙවිමි" දෙවියන් වහන්සේගේ උදහසේ හස්තය ඉවත්කරගෙන ඊශ්‍රායෙල් සෙනගව පවිත්‍රකරන පිණිස දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතරේ මැදහත්කරුවෙක් ලෙස එක් මනුෂ්‍යයෙකුගේ හෝ සිටගැනීම දෙවියන් වහන්සේ බලාසිටින සේක. අවසානයේදී ඔවුන් තමන්ගේම ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ ප්‍රතිඵලය වශයෙන් විනාශයට ගොදුරුවීමට ඉඩහැරිය සේක.

කඩුල්ලේ සිටගැනීමට කිසිවෙකු සොයාගැනීමට නොහැකිවීම පුදුමසහගත විය. විශේෂයෙන් දේවමාළිගාව තුලවත් කඩුල්ලේ සිටීමට කෙනෙකු නොසිටීම ගැන සැලකිල්ලෙන් යුතුව බලන්න. ආගමික කටයුතු වල යේදීමට සහ ශුද්ධලියවිල්ල අධ්‍යනය කිරීමට දේවමාළිගාවට සියළු ආකාරයේ ස්වභාවයෙන් යුතු සෙනග පැමිණියෝය. ඒ දවස්වලදී අඩුතරමින් ස්වල්ප දෙනෙක්වත් තමන්ගේ ජීවිතවල සදාචාරත්මක ගුණාංග හරිගස්වා ගැනීමට ක්‍රියා කලේ නැත. එබැවින් ඔවුන්ට උපකාර කිරීමට දෙවියන් වහන්සේට නොහැකි විය. කඩුල්ලේ සිටීමට කෙනෙකු නොසිටිය නිසා දෙවියන් වහන්සේ පුදුම වූ සේක. කිසිවෙකු දෙවියන් වහන්සේගේ ශුද්ධ ලියවිලි අධ්‍යනය කිරීමට හෝ අවබෝධ කරගැනීමට කටයුතු නොකළ නිසා කඩුල්ලේ සිටගැනීමට දෙවියන් වහන්සේට කිසිවෙකු සොයාගැනීමට නොහැකි විය. එබැවින් දයාවෙන් පුර්ණවූ උන්වහන්සේව විශ්වාස කිරීමට හැකිවූ කිසිවෙක් සිටිය හැකිද.....?

විශේෂයෙන් දෙවියන් වහන්සේගේ සෙනග වශයෙන් අපි මැසිවිලි නැගීම කරුණු කොටගෙන විනිශ්චයට ඉහළින් කරුණා වේ ජයග්‍රහණය අමතක කිරීමෙන් විනිශ්චයේ හැගීම සහිත සිතුවිලි ඇතිව සිටිනවා දැකිය හැකිය. අපගේ වීදි දෙස බලද්දී, අපගේ ප්‍රවෘත්ති අසද්දී දෙවියන් වහන්සේ නිශ්චිතවම විනිශ්චය කිරීමට තීන්දුකර ඇතිබව අපි දකින්නෙමු. අපගේ දෑස් ඉදිරියෙහි වර්ධනය වෙන්නාවූ සාක්ෂිමත් විනිශ්චය පැමිණිය යුතු යැයි පහසුවෙන්ම එකඟවීමට පුළුවන. නමුත් ඒ සියල්ලේදී අපි සැබවින්ම දෙවියන් වහන්සේගේ සිත අවබෝධකරගෙන නැත. මක්නිසාද දෙවියන් වහන්සේ දයාව දැක්වීමට මහත්වූ ආශාවෙන් සිටින බව විශ්වාස කරමින් ඊට ළඟාවීමට අපි ඇළුම්වන්නේ නැත.

2 පිටුවට

1 පිටුවෙන්

මම ඔවුන් අතරේ මනුෂ්‍යයෙකුව...

ආත්මික පිබිදීම

කෙසේවෙතත්, යහපත් පණිවිඩය නම් ඉතිහාසය පුරාම පවතින මම ප්‍රකාශ කිරීමට කැමති වචනය, **"ආත්මික පිබිදීමයි."** යම් කෙනෙක් හෝ සමහර විට බොහෝ සෙනගක් ක්ෂණිකවම දෙවියන් වහන්සේගේ කැමැත්ත දැන ගැනීමට පැමිණෙන විට නැවත ගොඩනැගීම සහ සුවය ගෙන එන්නෝය. අපගේ දිළිඳුකම මධ්‍යයේ නැවත වාරයක් දෙවියන් වහන්සේගේ වස්තුව වන උන්වහන්සේගේ සෙනගව නිදහස් කිරීම උදෙසා සහ ඔවුන්ට ආශීර්වාද කිරීම උදෙසා උන්වහන්සේගේ කැමැත්ත කුමක්දැයි ඔවුන් අවබෝධ කරගනු ලබන්නෝය. අපගේ ශක්තිය තුලනොව නමුත් අපගේ දුර්වලකම තුල අපව සෝදිසි කිරීමට උන්වහන්සේ කැමැත්තෙන් සිටින සේක. සියල්ලට පසුව අප ශක්තිමත්ව සිටින විට දෙවියන් වහන්සේ ගේ සිංහාසනය වෙතට පැමිණීමට ශුද්ධ ලියවිල්ලේ අපට ආරධනා නොකරන අතර ඇත්තටම කියනවා නම් අප දුර්වලව සිටිනවිටදී අපගේ අවශ්‍යතාවයන් වලට උපකාරය අවශ්‍යය යැයි හැගෙන විට අපි උන්වහන්සේගේ සිංහාසනය ඉදිරියට පැමිණිය යුතුය.

"එක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පුජකයෙක් නොව පව් කිරීමක් නැතුව සියළු ආකාරයෙන්ම අප වගේ පරීක්ෂාකරනු ලැබූ උත්තම පුජකයෙක්ය. එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම් වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු." (හෙබ්‍රෙව් 4 :15-16)

එය වෙන්දේසිකරුවෙක් සම්පුර්ණයෙන්ම බලාපොරොත්තු නොවන අවස්ථාවක ක්ෂණිකවම තිරයකින් පසුපසට කර වසා තිබෙන සහ විශ්වාස කල නොහැකි පිළියෙළ කර තිබෙන වස්තුව නිරාවරණය කරන්නාක් මෙන්වේ. දෙවියන් වහන්සේගේ බලයේ සහ දයාවේ ඇති විශේෂවූ වස්තුව පිළිගෙන ඒ තුල පැවතීම අපගේ කාරණයයි. සෙනග දෙවියන් වහන්සේ කථාකරන වචනයට ඇහුම්කන්දීමට ආරම්භ කරනවිට පිබිදීමේ මොහොත ආරම්භ වන්නේය. අපගේ දේශය විනාශය කරා ගමන්කරන බව අපි දනිමු. වර්තමාන අනාගතවකතෘවරු සෙනගට මග පෙන්වනවා වෙනුවට සෙනගව බල රහිත තත්වයට පත්කරති. ඔවුන්ගේ වැරැද්දට රුකුල් දෙන ආකාරයට ඔවුන් වටා ඇති ආගමික ක්‍රමවේදයන් නිර්මාණය වී ඇත. අනාගතවකතෘවරු සෙනගව පිඩනයට ලක්කර ඔවුන්ගෙන් කොල්ලකමින් දීළිඳු සහ අවශ්‍යතාවයන් ඇති අයව වෙහෙසට පත්කර ඇත. එසේවුවත් දයාවෙන් පුර්ණ වූ දෙවියන් වහන්සේ දෙස බලාසිටීමට මම කැමැත්තෙමි.

එසකියෙල්ගේ දවස්වලදී එය විය හැකිව තිබුණේ ද.....? මැදහත්කරුවෙක්වීමේ මෙම අරමුණ උදෙසා දෙවියන් වහන්සේට පාවිච්චි කිරීමට හැකි විශ්වාස කළාවූ කිසිවෙක්ව උන්වහන්සේට සම්බ නොවීය. සියලුම ස්වාභාවයන් ඔවුන්ට විරුද්ධව තිබියදීත් මැදහත් කාරකම් කිරීමට කිසිවකු නොසිටීම පුදුමසහගත නොවේ ද.....? සමහර විට එහි දී දෙවියන් වහන්සේ දයාව දැක්වීමට කැමැත්තෙන් සිටින බව සැබැවින්ම යම් කෙනෙක් විශ්වාස කරමින් ඒ අතරම තමන්ගේ ම මාර්ග දෙස බලමින් ඒ තුලට ගමන් කිරීමට තීරණය ගෙන දෙවියන් වහන්සේට කරුණාව දැක්වීමට පුළුවන් බව මම සිතන්නෙමි. නමුත් මා තල ඒ දයාව (කරුණාව) නොලැබූවෙමි කියන්නට ඇත. ගිඩියොන් වෙතට වේයන් වහන්සේගේ දයාව පැමිණිවිට ඔහු තුලත් හටගෙන තිබූ වැරදි තීරණය වෙත අවධානය යොමු කර බලන්න. ඊශ්‍රායල්වරු අස්වැන්න නෙළාගැනීමට උත්සහකරද්දී මිදියන්වරු පැමිණ ඒ සියල්ල කොල්ල කෑවෝය.සියල්ලට පසුව දෙවියන් වහන්සේ ගිඩියොන්ට ප්‍රකාශ වී(විනිශ්චයකාරයා 6 : 12) කියා ආමන්ත්‍රණය කලසේක. ගිඩියොන් දෙවියන් වහන්සේගේ පණිවිඩකරුවා වූ ස්වාමීන් වහන්සේගේ දූතයාගෙන් මෙසේ ප්‍රශ්ණකර සිටියේය. මාගේ පියාගේ පවුල ඔහුගේ ගෝත්‍රයේ කුඩාම පවුලයි. මම මාගේ පියාගේ පවුලේ කුඩාම තැනැත්තායි. ඔබවහන්සේ මට මෙසේ කථා කරන්නේ දැයි ඇසීය. මාගේ පියාට අයිති සීමාවේ ඔහුට අයිති බාල්ගේ පූජාසනයක් තිබෙන බව ගිඩියොන් ප්‍රකාශ නොකිරීම ගැන ඔබගේ අවධානය යොමු කළේ ද...? ඔබ නිවැරදි කාරණය නිශ්චිතවම පවසනවාද... ?

එසේවුවත් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ වචනය ගිඩියොන් වෙතට එවුසේක. මෙම සිදුවීම අවසානයේදී ස්වාභාවිකව මනසට පැමිණෙන හැඟීමකින් නොව නමුත් දෙවියන් වහන්සේගේ සැලැස්ම අනුගමනය කරමින් ගිඩියොන් සහ ඔහුගේ හමුදාව වූ තුන්සියයක් මනුෂ්‍යයන් ගොස් මිදියන් වරුන්ව පරාජයකර මහත් ජයග්‍රහණයක් ලැබූවෝය. (විනිශ්චයකාරයා 7:20-22) අපි දෙවියන් වහන්සේගේ බලවත් මනුෂ්‍යයකුවීමට නම් උන්වහන්සේගේ නියමයන් පැවැත්විය යුතුය.

කෙසේ හෝ දෙවියන් වහන්සේගේ දයාවේ මොහොත ගිඩියොන් පසුකර ගියානම් සිදුවන්නේ කුමක්ද.....? දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙකු ව සොයද්දී මෝසෙස් හෝ එස්තර් වැනි අයව සොයා ගැනීමට උන් වහන්සේට නොහැකි වූ සේක් නම් සිදුවන්නේ කුමක්ද.....? ඊශ්‍රායෙල් සෙනග මිසරයේ වහල්ව සිටිද්දී මෝසෙස් පාරාවෝ ඉදිරියේ පෙනීසිටීම හෝ එස්තර්ගේ දවස්වල දී යුදෙව් සෙනග විනාශයට ගොදුරු වීමට යනවිට රජු ඉදිරියට ගොස් තමන්ගේ සෙනඟගේ අනාගතය වෙනුවෙන් එස්තර්ගේ පෙනී සිටීම සිදුනොවුයේ නම් සිදුවන්නේ කුමක්දැයි අපි නොදනිමු.

අපගේ පරම්පරාව තුල නැවත වාරයක් වස්තුව නොවැසූ තත්වයේ පවතින්නේ ය. වෙන්දේසි කරු සෙනග ඉදිරියේ සිටිමින් මෙලෙස පවසන්නේය. මෙහි මිලකල නොහැකි වස්තුවක් ඉදිරියේ සිටින්නෙමි. මෙය අනාවරණය වන්නේ යම් යම් කාලවල දී පමණි. කවුද මේ වස්තුව උදෙසා ඩොලර් සියයක් දෙන්නේ..... ඩොලර් පනහක්..... නිශ්ශබ්දතාවය පැවතීම නිසා එසේනම් ඩොලර් විසිපහක්..... දහයක්..... පහක්..... මේ වස්තුව උදෙසා එක ඩොලරයක්වත් දෙන්නේ කවුද.....?

ඒ හා සමානවම දෙවියන් වහන්සේගේ මහිමය උදෙසා පාවිච්චි කිරීමට අවශ්‍යවන්නා වූ මනුෂ්‍යයන් වන පුරුෂයන් සහ ස්ත්‍රීන් ව උන්වහන්සේ කැඳවන සේක. එම කාරණය තුල ඔබ සහ මම එක් දවසකදී දෙවියන් වහන්සේගේ සිංහාසනය ඉදිරියේ සිටින්නෙමු. ඉතිහාසයේ විවිධ වූ අවස්ථාවලදී දෙවියන් වහන්සේ ඉදිරියේ සිටීමට යම් කෙනෙක් ව සොයමින් උන්වහන්සේ කථාකල බව අපි අවබෝධ කර ගන්නෙමු. ජාතියේ මනුෂ්‍යයන්ව වෙනස් කිරීමට විශාල ජනසමූහයක් යොදා නොගන්නා බව මතක තබා ගන්න. අසල්වැසියා ව වෙනස් කිරීමට සියගණන් තෝරානොගන්නා සේක. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ දයාව පෙන්වීමට කැමැත්තෙන් සිටින බව විශ්වාස කරන එක් අයෙකු පමණක් තෝරා ගන්නා සේක.කෙසේ වෙතත් කිසිවෙක් පියවරක් ඉදිරියට නොතබන්නේ නම් නැවත වාරයක් වස්තුවේ අයිතිය අහිමි වන්නේය. එය අනාගතයේ අවස්ථාවකදී යම් කෙනෙක් අනාවරණය කරන තෙක් සැඟවී තිබේ මනුෂ්‍යයන් විනාශ වෙමින් පවතින්නේය. අපි එවැනි කාලවකවානුවක ජීවත්වෙන බැවින් දෙවියන් වහන්සේ යම් කෙනෙක්ව සොයමින් සිටින නමුත් උන්වහන්සේගේ කරුණාවෙන් පූර්ණ ව සිටින බව විශ්වාස කරන්න කෙනෙක්ව සොයාගැනීමට නොහැකිව හෝ මෙම අරමුණ උදෙසා ඔවුන් පාවිච්චි කිරීමට නොහැකිව තිබේ. එබැවින් ශුද්ධ ලියවිල්ලේ පවසා තිබෙන ලෙස සහ දෙවියන් වහන්සේගේ උදහස ඇවිලී සෙනගගේ ක්‍රියාමාර්ග ලෙස ප්‍රතිවිපාකය ඔවුන්ගේ හිස මතට පැමිණෙන්නේය.

ඇදහිල්ලේ තුල පියවරක් ඉදිරියට තබමු....

මේ පැයේ දී දෙවියන් වහන්සේ අපව පාවිච්චි කිරීම උදෙසා අපි ආශාවෙන් සිටින්නේ නම්, අපි ඇදහිල්ල තුල පියවරක් ඉදිරියට තැබීමට කැමති විය යුතුය. ද්‍රාවිත් ඊශ්‍රායල් කඳවුරට යද්දී පිලිස්තී යෝධයා දෙවියන් වහන්සේගේ සෙනගට නින්ද්‍රාකරනවා ඇසුණේය. (1 සාමුවෙල් 17 : 23) දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ උන් වහන්සේගේ නාමයට අපකීර්තිය ඇති කිරීමට පුළුවන්ව තිබීම ගැන ද්‍රාවිත් පුදුමයට පත්විය. මේ සටන කරන්නට කිසිවෙක් නැත්තේ ඇයි කියා ඔහු ඇසුවේය. සියළු දෙනා මේ වන මේ වනතෙක් බලා සිටින්නේ ඇයි.....? දෙවියන් වහන්සේ අපේ පැත්තේ සිට ක්‍රියා නොකරන සේක්ද.....? එසේ වුවත් ඊශ්‍රායෙල් ද්‍රවිත් සමඟ අමනාප විය. "කිසිවෙකුගේ සිත ඔහු නිසා ක්ලාන්ත නොවේවා..., මම ගොස් මේ පිලිස්තියා සමඟ සටන් කරන්නෙමි."

කියා ද්‍රවිත් කිවේය. නැවත වාරයක් දෙවියන් වහන්සේගේ දයාවෙන් පුර්ණ වූ කැමැත්ත විශ්වාස කරන්නාවූ කෙනෙක් ඉදිරිපත් වුයේය. ද්‍රවිත් ඉදිරියට යමින් දොලෙන් ගල්කැට පහක් අහුලාගත්තේය. දෙවියන්වහන්සේ කුඩා අයව තෝරාගෙන උන්වහන්සේගේ මහිමය උදෙසා ඔවුන්ව පවිච්චි කරන බව ද්‍රවිත් විශ්වාස කළේය. සෑබැවින්ම ද්‍රවිත් ගොලයත්ව පරාජය කලවිට දෙවියන් වහන්සේගේ සෙනගව නැවත වාරයක් ඇදහිල්ල වෙතට ගෙන එනු ලැබුවෝය.

ඇදහිල්ලේ මෙම ස්වාභාවය සහ අපගේ පරම්පරාව තුල දෙවියන් වහන්සේ බලා සිටින්නේ මොනවදැයි.....? ඇදහිල්ල යනු කුමක්දැයි හෙබ්‍රෙව් යැවුම් පත්‍රයේ මෙලෙස පැහැදිලිකර තිබේ.

"ඇදහිල්ලේ නම් බලාපොරොත්තු වන දේවල් ගැන සහතිකයය. නොදන්නා දේවල් ගැන ඔප්පුවය. එයින් වැඩිවහල්ලන්ට සාක්ෂි ලැබුණේය. දෙවියන් වහන්සේගේ වචනයෙන් ලෝකවල් වචනු ලැබූ බවද, වෙසේ දකින දේවල් පෙනෙන දේවලින් හට නොගත් බවද ඇදහිල්ලෙන් තේරුම් ගනිමුව."

(හෙබ්‍රෙව් 11 : 1 - 3) මෙම වචනය තවත් ආකාරයකින් පවසන්නේ නම් "මම ප්‍රකාශ කර තිබෙන්නාවූ මාගේ වචනය මුළු හදවතින්ම පැමිණෙන්නාවූ සම්පුර්ණ ඇදහිල්ලෙන් විශ්වාස කරන්නව මට අවශ්‍යව තිබේ." කිසිදෙයක් නැතිව දෙවියන් වහන්සේ විශ්වය මැවූ සේක, දෙවියන් වහන්සේට මාව පාවිච්චි කිරීම උදෙසා මම ඉඩනොදී සිටින්නෙම්ද....? දෙවියන් වහන්සේගේ වචනය මම මගේ මුළු හදවතින්ම අනුගමනය (වැළඳ ගැනීම) කල යුතුය.

ඇදහිල්ලෙන් අදහස් කරන්නේ කන්නාඩිය දෙස නොබලා එයින් ඉවත බලාසිටීම මෙන්වේ. අපි අප ගැනම විශ්වාස නොකර අපට ඉවත බලාසිටීම මෙන්වේ.

අපි අප ගැනම විශ්වාස නොකර අපට ප්‍රකාශකර තිබෙන හෝ අණකර තිබෙන පරාජිත වූ සියළු මනුෂ්‍යය හඬ

7 පිටුවට

දෙවියන් වහන්සේගේ වචනය මත සිට යාච්ඤා කරමු

(රිවි කැම්බෙල් විසිනි)

සාර්ථකත්වයට අත්‍යවශ්‍ය දෙවියන් වහන්සේගේ ආශිර්වාදය පෙරමග දූතයා පත්තරය වෙත දෙවියන් වහන්සේ නොකඩවා ලබාදුන්සේක. දෙවියන් වහන්සේගේ වචනය මත යාච්ඤා කිරීම ඉතා තද බලපෑමක් ඇති කරන බව පෙරමග දූතයා කාර්‍යමණ්ඩලය අවබෝධ කරගෙන ඔබවත් ඒ සඳහා එක්සත් කරගනිමින් යෙසායා 55 ඃ වන පරිච්ඡේදයේ පදනම මත සිට යාච්ඤා කිරීම සඳහා යොමු කිරීමට සිතුවෙමු.

එවිබා පිපාසා ඇති සියල්ලෙනි, වතුර ළඟට වරෙල්ලා, වුදල් නැත්තෙනි, නුඹළාත් ඇවිත් ධාන්‍ය අරන් කාපල්ලා, එසේය. ඇවිත් මිල වුදල් නැතුව වුදිකපානය ද කිරිද ගනිල්ලා, කෑව නොවන දේට වුදල්ද තෘප්තියට නොපවුණුවන දේට නුඹළාගේ වස්තුව ද වියදම් කරන්නේ මක්නිසාද....? හොඳකාරයෙන් වට අහුවිකන් දී හොඳව තිබෙන දේ කාපල්ලා. නුඹළාගේ ප්‍රාණය ද තරකව භුක්ති විඳීවා. නුඹළාගේ කන්යොමා මා ළඟට ඇවිත් අසාපල්ලා එවිට නුඹළාගේ ප්‍රාණය ජීවත් වන්නේ ය. මවද ද්‍රාවිත්ගේ සහනික කරුණාවල් වන සදකාල ගිවිසුමක් නුඹළා සමග කරන්නෙමි..
(යෙසායා 55 : 1 3)

ආත්මික ජීවිතයේ පිපාසය ඇති අයට උන්වහන්සේ තුල ජීවනයේ බහුලත්වය අත්දැකීමට ආරාධනා කර ඇති නිසා සහ උන්වහන්සේ එම නිදහස් සහ උතුම් වූ ජීවිතය පිළිගන්වා තිබෙන නිසා උන් වහන්සේට ස්තුතිවේවා.

දෙවියන් වහන්සේ පෙරමග දූතයා සේවය සඳහා දී තිබෙන්නා වූ ආර්ථික උපකාරයන් ගැන උන් වහන්සේට ස්තුති කරමු. අනිත් අය සමඟ නිදහසේ උන්වහන්සේගේ පණිවිඩය බෙදා ගැනීමට රි උන්වහන්සේගේ උතුම් වූ ආශිර්වාදය ගැන උන් වහන්සේට ස්තුති කරමු.

පෙරමග දූතයා සේවය නොකඩවා අනිත් අයගේ ආත්මික වර්ධනය සඳහා අවශ්‍ය පෝෂණය ලබා දීමේ උන්වහන්සේගේ එක් මාධ්‍යයක් වීම උදෙසා යාච්ඤා කරන්න. දෙවියන් වහන්සේ උන් වහන්සේ වෙතට කැඳවා තිබෙන නිසා අපේ ආත්ම තුල උන්වහන්සේගේ අපේක්ෂාවෙන් බලවත් ලෙස ඉටු කිරීමට දැඩි ආශාවෙන් සිටි නිසා උන් වහන්සේට ස්තුති වේවා පෙරමඟ දූතයා සේවය තුළින් දෙවියන් වහන්සේ උන් වහන්සේ වෙතට බොහෝ මනුෂ්‍යයන් ගෙනෙන පිණිස යාච්ඤා කරන්න.

".....එවම ද දාවිත්ගේ සහනික කරුණාවල් වන සදකාල ගිවිසුමක් නුඹළා සමග කරන්නේමි. බලව, උන්වහන්සේ ජනයන්ට සාක්ෂිකාරයෙක් ද, ජනයන්ට අධිපතියෙක් හා ආඥාදායකාරයෙක් ද කොට දුනිවි. බලව, නුඹ නොදන්නා ජාතියක් නුඹ අඬගසා ගන්නෙහිය. නුඹව නොදැන සිටි ජාතියක් ද නුඹේ දෙව් වූ ස්වාමීන් වහන්සේ සහ විශ්වයේ ශුද්ධ තැනැත්තා වහන්සේත් නිසා නුඹ ළඟට දුවච්චනවා ඇත. මක්නිසාද උන්වහන්සේ නුඹට ගෞරවකර තිබේ."
(යෙසායා ෫෫ ඃ 3 - 5)

යුදෙව් සෙනඟට දෙවියන් වහන්සේ දක්වා තිබෙන්නා වූ උන්වහන්සේගේ විශ්වාසවන්තකම ගැන සහ අන්‍යජාතීන් වෙත පතුරුවා හැර තිබෙන දෙවියන් වහන්සේගේ කරුණාව නිසා උන්වහන්සේට ස්තුති වේවා. පෙරමුග දූතයා සේවය කාර්‍යයන් නොකඩවා සිදු කරන පිණිස ගැලවීම ගැන ප්‍රකාශකරන පත්‍රිකා වෙනුවෙන් සහ පෙරමඟ දූතයා අන්තර්ජාතික සේවයන් උදෙසාද යාච්ඤා කරන්න. ***"ස්වාමීන් වහන්සේ සම්බවෙන්ට සිටිද්දී උන්වහන්සේ සොයා උන්වහන්සේ ළංව සිටිද්දී උන් වහන්සේට යාච්ඤා කරපල්ලා. දුෂ්ඨයා තමාගේ මාර්ගයද, අධර්මිෂ්ඨ මනුෂ්‍යයා තමාගේ යෝජනා ද අත්හැර ස්වාමීන් වහන්සේ වෙතට ඒවා උන්වහන්සේ ඔහුට අනුකම්පා කරනවා ඇත. අපේ දෙවියන් වහන්සේ වෙතට ඔහු හැරී ඒවා. මක්නිසාද උන්වහන්සේ අතිශයින් කමා වෙනවා ඇත. මක්නිසාද මාගේ යෝජනා නුඹළාගේ යෝජනා නොවේය. නුඹළාගේ මාර්ග ද මාගේ මාර්ග නොවේයැයි ස්වාමීන් වහන්සේ කියනසේක. අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක් වෙන් මාගේ මාර්ග නුඹළාගේ මාර්ගවලටත්, මාගේ යෝජනා නුඹළාගේ යෝජනා වලටත් වඩා උසස් ව තිබේ."***

දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම සහ ශුද්ධකම ගැනත් උන්වහන්සේගේ ක්‍රියාමාර්ග අපගේ යෝජනා සහ ක්‍රියාමාර්ග වලට වඩා උසස්ව තිබෙන නිසාත් උන්වහන්සේට ස්තුති කරන්න. දෙවියන් වහන්සේ වෙතට හැරී එන්නන්ට සමාව ලබාදීමට සහ කරුණාව විදහා දැක්වීමට දැඩි ආශාවෙන් සිටින නිසා උන් වහන්සේට ස්තුති වේවා. පෙරමග දූතයා පත්තරයේ පණිවිඩය දෙවියන් වහන්සේ උසස් කරන ලෙස සහ ආත්මික උද්යෝගයෙනුත් විශ්වාසයෙනුත්, පූර්ණ වන පිණිස යාච්ඤා කරන්න.

"එලෙස වැස්ස සහ හිම අහසෙන් බැස පොළොව පොඟවා සශ්‍රීකකර, වල හටගන්නවා, වපුරන්නට බීජද කන්නාට කැවද දෙන තුරු එහි හැරී නොයන්නාක් වෙන් මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවත් මා කැමති දේ සිදුකොට මා නියමකළ කාර්ය්‍ය සඵල කරනවා ඇත." (යෙසායා 55 ඃ 10 - 11)

ආත්මික ව සහ භෞතික ව දෙවියන් වහන්සේගේ සැපයීම නිසා උන් වහන්සේට ස්තුති වේවා. දෙවියන් වහන්සේගේ වචනය බලයෙන් පූර්ණව උන් වහන්සේගේ අභිප්‍රාය සම්පූර්ණ කරන නිසා උන් වහන්සේට ප්‍රශංසා වේවා.

දෙවියන් වහන්සේගේ බලයෙන් පුර්ණවූ ආලේපය කරුණු කොට ගෙන පෙරමඟ දූතයා පත්තරේ පණිවිඩ කියවන්නා වූ අයගේ ජීවිතවලට මහත් වූ බලපෑමක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

"මක්නිසාද නුඹළා ප්‍රීතියෙන් පිටත්ව සමාදානයෙන් ගෙනයනු ලබන්නාහුය. නුඹළාට ඉදිරියෙන් කඳු හා හෙල් ගී නාද කරන්නෝය. වනයේ සියළු ගස් අත්පොළසන් දෙන්නෝය. කටු ගස වෙනුවට දේවදාරු ගස ද. තිබෙර්ල් ගස වෙනුවට මඩ ගසද හටගන්නේය. ඒක ස්වාමීන් වහන්සේට නාමයක් සහ වැකිනොයෙන සදකාල ලකුණක්ද පිණිස වන්නේය." (යෙසායා ෫෫ ඃ 12 - 13)

නැවත ගොඩනැගීමට, නැවත අළුත් කිරීමට, නැවත පුබුදුවාලීමට බලය ඇති ජීවනයේ දෙවියන් වහන්සේ, උන් වහන්සේ නිසා උන් වහන්සේට ප්‍රශංසා වේවා.

පෙරමඟ දූතයා සේවය තුලින් ආත්මික වෙනස් වීමක් සහ පිබිදීමක් ගෙනඒමට උපකාරකරන මෙන් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න. පොළොව පිට උන් වහන්සේගේ නාමයට මහිමය ගෙන ඒමට මෙම සේවය පාවිච්චි කරන ලෙස උන්වහන්සේට යාච්ඤා කරන්න. පෙරමඟ දූතයා පත්තරය කියවන අයව ධෛර්‍යමත් කරමින් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ඔවුන් වෙනුවෙන් අයැද සිටින්නෙමු. ඔබට ඒ ආශිර්වාදය හිමිවනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු.

ජයග්‍රාහීව යාච්ඤා කිරීමෙහි පැවතීම සභාවේ අවශ්‍යතාවයයි

(වෙස්ලි එල්. ඩිවෙල් විසිනි)

වර්තමානයේ පුරුෂයන් සහ ස්ත්‍රීන් ජයග්‍රාහීව යාච්ඤා කිරීමෙහි පවතින්නේ කෙසේදැයි අවබෝධ කර ගනු ලැබීම දෙවියන් වහන්සේට මහත් ලෙස අවශ්‍යව තිබෙන සේක. ශක්තිය ඇතිව පැවතීමට හැකියාව තිබෙන, යාච්ඤා සටනේ ධෛර්‍යයෙන් යුතුව (පසුබට නොවී) යෙදෙන්නා වූ මනුෂ්‍යයන් ස්වර්ගීය බලය නිදහස්වනතෙක් යාච්ඤා කරන්නා වූ සහ දෙවියන් වහන්සේගේ කැමැත්ත පොළොව මත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නා වූ මනුෂ්‍යයන් බලත්ව වූ මැදහත්කරුවන් වේ.

යාච්ඤාවේ වීරයන් දෙවියන් වහන්සේගේ හදවත දැකීම (වටහාගැනීම) අපට අවශ්‍යව තිබේ. ඔවුන් කුරුසියේ තේජස සහ බලය අත්දුටු අය විය යුතුය. ස්වර්ගයේ, නිරයේ, විනිශ්චය දවසේ වැදගත්කම සහ බයිබලයේ අදහස් කරන දෙය අවබෝධ කරගත යුතුය. අපි යාච්ඤා වීරයන් වශයෙන් වහල්කම ගැන සදාකාල බලාපොරොත්තුවෙන් බැහැරව සිටීම. ගැන සහ ගැළවීම නොලැබුවන්ට ලැබෙන ඉරණම (විනාශය) ගැන හැගෙන්නාවු අය විය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ ලබාදෙන ගැලවීම කරුණු කොටගෙන හිමිවන්නා වූ තේජස, ප්‍රීතිය, සම්පූර්ණයෙන්ම වෙනස්වීමේ බලය දැනගත යුතුය. අපි යාච්ඤාවේ වීරයන් වශයෙන් දෙවියන් වහන්සේව, දෙවියන් වහන්සේ ලෙසත්, සාතන්ව, සාතන් ලෙසත් අවබෝධ කරගත යුතුයි.

ජයග්‍රාහීව යාච්ඤා කිරීම තුල පවතින අයව දෙවියන් වහන්සේ සොයන සේක. ලෝකයේ මනුෂ්‍යයන් ව ගැළවීමට ගෙනඒම සඳහා සහ ලෝකයේ ක්‍රියාකාරකම් ධර්මිෂ්ඨකමට ගෙන ඒම සඳහා උන්වහන්සේගේ ආලේපය ඔවුන්ට ලබා දෙන සේක. ජයගත්තාවු මනුෂ්‍යයන්ව දෙවියන් වහන්සේ සොයනසේක. මක්නිසාද පොළොවේ මිලියන ගණන් මනුෂ්‍යයන් ඔවුන්ගේ පාපය තුල, අවශ්‍යතාවයන් තුල සිටින බවත්, එමෙන්ම පාපයෙන්, සාතන්ගෙත්, නිරයෙන් ඔවුන්ව ගළවා ගැනීමට ආශාවෙමින් බොහෝසෙයින් ඔවුන්ට ප්‍රේමකරන්නන් සිටින බවත් දෙවියන් වහන්සේ දකින සේක. මේ වන විටත් ඔවුන් ගෙවිය යුතුව තිබූ වන්දිය ගෙවා තිබෙන සේක. කල්වාරියේ පූජාව කරුණු කොටගෙන සදාකාලයටම ජයග්‍රහනය සම්පූර්ණකර තිබෙන සේක. සියළු දේ සූදානම් ව තිබෙන නමුත් පාපය කරුණු කොටගෙන මනුෂ්‍යයා අන්ධ වී, සිරකරුවන් වී සහ මුරණ්ඩුවී සිටිති.

පොළවේ මිලියන ගණන් ජයග්‍රාහි ලෙස යාච්ඤාවේ යෙදෙන්නේ පමණක් දෙවියන් වහන්සේගේ බලාපොරොත්තුව වනසේක. මේ හේතුවෙන් යේසුස් වහන්සේ සමඟ රෑ දවල් අපගේ සම්බන්ධතාවය පවත්වාගැනීම අවශ්‍ය තිබේ. යාච්ඤා කිරීම තුලින් ජාතින්ව ගැළවීමට ගෙනඒමට දෙවියන් වහන්සේ ආලේප කර තිබෙන සේක. (ගීතාවලිය 2 ඃ 8) ඒය උන්වහන්සෙගේ සදකාල නියමයේ කොටසක් වේ. එබැවින් යේසුස් වහන්සේ යාච්ඤා කලාක් මෙන් අපිත් යාච්ඤා කල යුතුය.

අපි දෙවියන් වහන්සේට විරුද්ධව වරදකර ඇත්තෙමු.

දෙවියන් වහන්සේගේ හදවතේ ඇති මහත් වූ ප්‍රේමයට විරුද්ධව මිලියන ගණන් කිතුණුවන් සැලකිල්ලක් නැතිව පව් කරමින් බෙලහීනව සිටිති. ඔවුන් තමන්ගේ ගැළවුම්කරුවාණන්ගේ කුරුස පත්වීම, නැවත නැගිටීම සහ සිංහාසනාරූඩවීම බිඳ දමා ඇත. ඔවුන්ගේ නොමේරූ මැදහත්කාරකමේ ආත්මය කෙඳිරිගාමින් අසාර්ථක වන්නෝය. දෙවියන් වහන්සේ දයාව දැක්වීමට බොහෝ ආශාවෙන් සිටින සේක. (යෙසායා 30 ඃ 18) එමනිසා අපගේ අසාර්ථකවීම්

4 පිටුවට

3 පිටුවෙන්

ජයග්‍රාහීව යාච්ඤා කිරීමෙහි..

වැළක්වීම් කරුණු කොට ගෙන අපව සාඳ තිබෙන, අපව ගළවා තිබෙන, අපව ආරක්ෂා කර තිබෙන කාර්‍ය්‍යායය අද දවසේදීත් සම්පූර්ණ කරන සේක.

සභාවන් කිතුණු සේවයේ සඳහා පිහිටුවා තිබෙන සංවිධාන, කිතුණු ආයතන ඉතා ඉහළින් සංවිධානගත වී හොඳ කාර්‍ය්‍යමණ්ඩල ඇතිව සහ ඔවුන් සියල්ලෝම වැඳගත් වූ ක්‍රියාවලියන් තුල වෙහෙසව වැඩ කරමින් කාර්‍ය්‍යබහුලව සිටිති. නමුත් එහි ප්‍රතිඵලය කුමක්ද.....? ඒ අතරම ඔවුන් යාච්ඤා කිරීම අත්හැරදමා නොතිබිය යුතුය. අපගේ සෙනගට යාච්ඤා කිරීම තුල ජයග්‍රාහීව සිටීමට අපි උගන්වන්නේ නැතිනම් අපි අසාර්ථක වන්නේමු. එමෙන්ම යාච්ඤා කිරීමේහි පැවතිමෙන් බලයෙන් පූර්ණ ජීවිත ගත කිරීම සහ ඒ සඳහා ඔවුන් යොමු කිරීම අසාර්ථක වන්නා වූ ආදර්ශයක් ඔවුන්ට ලබා දෙන්නෙමු.

යාච්ඤා කිරීමට අපොහොසත්වීම අනුවණකමකි. නමුත් මිලියන ගණන් කිතුණුවන් සම්පූර්ණයෙන්ම අනුවණව සිටිනවා පෙනෙන්නේය. ඔවුන් යාච්ඤා කිරීම කෙරෙහි විශ්වාසය ඇතිව සිටින්නෝය. ඔවුන් වැඩිපුර යාච්ඤා කරන්නේ අපරික්ෂාකාරීව (අවිධිමත්ව) සහ ප්‍රතිඵල රහිත වේ. නමුත් ඔවුන් ජයග්‍රාහිකව යාච්ඤා කිරීමෙහි පැවතීම තුලින් ඔවුන්ගේ ආත්මික ජීවිතයේ කාර්‍ය්‍යයන් ජයග්‍රහණය කරනැත. දෙවියන් වහන්සේගේ මහත් වූ බලය සෑමවිටම යාච්ඤා කිරීම තුලින් නිදහස්වන බව අවබෝධකරගෙන සිටිති. එසේවුවත් ඔවුන් ජයග්‍රාහිකව යාච්ඤා කිරීමට අපොහොසත්ව ඇත.

යම් ස්ථානයක කිතුණු නායකයන් වර්තමාන ශුද්ධවන්තයන්වන දේවදරුවන්ව යාච්ඤා කිරීමට උගන්වමින් ඒ සඳහා යොමුකරනවාද.....? යම් කෙනෙක් ජයග්‍රාහිකව යාච්ඤා කිරීම තුල පවතිනවා නම් පමණක් අනුගාමිකයන් වන අනිත් අයව ජයග්‍රාහිකව යාච්ඤා කිරීමට යොමුකරන්නේ කෙසේ දැයි.....? අවබෝධ කරගනු ලබති. එලෙස කරනු ලබන්නා වූ කිතුණු නායකයන් යාච්ඤාවේ වීරයන් බිහිකරනු ලබයි. ඒ අනුව සසඳ බලද්දී යාච්ඤා නොකරන්නාවු දේශනා කුඩුවක් හරහා යාච්ඤාව රහිත සහ බලය නැති සෙනගක් බිහිකරනු ලබයි. මේ වර්ථමාන පරම්පරාවට යාච්ඤා කිරීමට උගන්වමින් යාච්ඤා කිරීමට කැඳවන්නේ කවුද.....? අපගෙ යාච්ඤා වීරයන් කොහේද.....?

ක්‍රිස්තුස් වහන්සේ සමග මැදහත්කාරකම් කිරීමට අපව ආලේපකර තිබෙනසේක.

මහත්වූ මැදහත්කරුවාණන් ලෙස දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේව ආලේප කර තිබෙන සේක. මවනලද මුළු මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් මැදහත්කරුවණ වී, දැන් අප වෙනුවෙන් ස්වර්ගයට ඇතුල් වී අපගේ සදකාලික උත්තම පූජකයාවී සිටිනසේක. සියල්ලන් උදෙසා එකවරක් තම ජීවිතයෙන්ම පූජාවක්වී අපගේ උත්තම පූජකයා වූ සේක. ඒ නිසා උන්වහන්සේ මැදහත්කාරකම් කිරීමේ කාර්‍ය්‍ය නොකඩවා සදාකාලයටම පවතින සේක. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය. අපගේ ස්වාමීන් වහන්සේ සහ ගැළවුම්කරුවාණෝය. එබැවින් බලවත්ව, නොකඩවා සහ සම්පූර්ණයෙන් මැදහත්කාරකම් කිරීමේහි පවතින සේක.

දෙවියන් වහන්සේ මෙන් පෞරුෂත්වයක් සහ චරිතයක් අපතුල තිබෙන පිණිස දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ස්වරූපයෙන් අප මැවූසේක. ජොහෝවා දෙවියන් වහන්සේ සමග සම්බන්ධතාවය ඇතිව සිටීමට උන්වහන්සේ අපව මැවූසේක.මුළු මැවිල්ල අතරින් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ සමග සම්බන්ධතාවයක් ඇතිව සිටීමට අපව මවා තිබෙන සේක.(1 කොරින්ති 1 ඃ 9) ක්‍රිස්තුස් වහන්සේගේ මනාලියවීමට අපව නිර්මාණය කර තිබෙන සේක..... (යෙසායා 62 ඃ 5, යොහාන් 3 ඃ 29, එපීස 5 ඃ 25ී 27, එළිදරව් 21 ඃ 9)

එමෙන් ම දෙවියන් වහන්සේගේ පිළිතුරු පෙනෙන තෙක් ජයග්‍රාහීව යාච්ඤාවෙහි පැවතීමටත්, මැදහත්කාරකම් කිරීමටත්, අපව නිර්මාණයකර, ගළවා, සහ කැඳවා තිබෙන සේක. අද දවසේ ක්‍රිස්තුස් වහන්සේගේ මහත් වූ අවශ්‍යතාවය අපි ජයග්‍රාහීව මැදහත්කාරකමෙහි පැවැත්වෙමින් පොළොවේ උන්වහන්සේගේ තානපතියන් වීමය මනුෂ්‍යයා සහ මනුෂ්‍යයාගේ අවශ්‍යතාවයන් උන්වහන්සේ දකින ආකාරයෙන් දැකීමට හැකියාව ලැබෙන පිණස උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේව අපට ලබාදී තිබෙන සේක. අපගේ දුර්වල වූ යාච්ඤාවට උපකාර ලැබෙන පිණස උන්වහන්සේ අපව ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ආලේපකර තිබෙන සේක. (රෝම 8 ඃ 26) යේසුස් වහන්සේගේ නාමයේ ආධිපත්‍ය පාවිච්චි කිරීමට අපට බලය ලබාදී තිබෙන සේක. (යොහාන් 14 ඃ 13-14, 15 ඃ 16, 16 ඃ 23-24)

දෙවියන් වහන්සේට පූජකයෙක් වීමට උන්වහන්සේ අපව සාදා තිබෙන සේක. සියළු පූජකයන්ගේ කාර්‍ය්‍යය තුල නිශ්චිතවම මැදහත්කාරකමක් ඇතුලත්ව තිබේ. (එළිදරව් 1 ඃ 6) අපි ශුද්ධ වූ පූජකයන් පමණක් නොව (1 ප්‍රේතෑස් 2 ඃ 5) නමුත් රාජකීය පූජකයන් ද කර තිබෙන සේක.(1 ප්‍රේතෑස් 2 ඃ 9) අපගේ රජතුමාට සේවය කිරීමට අපව පත්කර ඇත. ශුද්ධ ලියවිල්ලේ තවත් ස්ථාන වල ලබාදෙන ආලෝකය තුල මෙම වගකීම පැහැදිලිවම අපගේ මැදහත්කාරකමේ කාර්‍ය්‍භාරයේ දී අපට දී තිබෙන්නාවු රාජකීය පැවැත්මත් ඇතුලත්කර තිබෙනසේක. මැදහත්කාරකම් කිරීමෙන් අපි රාජකීයත්වයට පැමිණෙන්නෙමු. අපගේ ජයග්‍රාහී මැදහත්කාරකම කරුණු කොටගෙන ක්‍රිස්තුස් වහන්සේ මෙන් නියෝග කිරීමටත්, ඒවා පතුරුවා හැරීමටත් හැකියාව ලබන්නෙමු. අපි යාච්ඤා කිරීමෙහි පැවැතීම කරුණු කොටගෙන ක්‍රිස්තුස්වහන්සේගේ ස්වආධිපත්‍යය අපට බෙදාදෙන සේක. උන් වහන්සේගේ රාජකීය ආධිපත්‍යයට අපව නියෝජිතයින් කරන සේක.

දෙවියන් වහන්සේ ස්වේජ්ජාවෙන්ම විසඳුම ලබානොදී අපගේ යාච්ඤා කිරීම කරුණු කොටගෙනත් ක්‍රියාකිරීම මත රඳ පවතිනසේක. සභාවේ යාච්ඤා කිරිම මත ලෝකය පාලනය කිරිමට අවශ්‍යය බලය ලබා දෙන සේක. අපගේ යාච්ඤා කිරිම කරුණු කොටගෙන දෙවියන් වහන්සේ කථාකරමින් ක්‍රියා කරන සේක. ඒ අතරම දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ ස්වාධිපත්‍යය තුල නිදහසේ ක්‍රියා කිරීමෙහිත් පවතින සේක. එසේවුවත් අපගේ මැදහත්කාරකම් කිරිම මත උන්වහන්සේගේ ක්‍රියාකිරිම් බැඳී පවතින බවත් පෙනෙන්නේ ය. එමනිසා ස්වර්ගීය බලය පොළවට ගෙනඑන නාලිකාව (මාධ්‍යය) බවට පත්වීමට අපව කැඳවා තිබෙන සේක. ක්‍රිස්තුස් වහන්සේ තුලින් ලෝකය මුදාගැනීමේදී අපි ඇදහිල්ලෙන් කරන්නාවූ කරන්නාවු යාච්ඤාවන් ඊට එකතුකර තිබෙන්නේ ඇයි කියා අපට ප්‍රශ්න කල නොහැකිය. යාච්ඤාකිරීමෙන් සාතන්ගේ බලය පලවා හැර (පරාජය කර) දෙවියන් වහන්සේගේ රාජ්‍යය උසස්කිරීමත් අදහස් කරනු ලබන්නේ ය.

ජයග්‍රාහිකාව යාච්ඤා කිරීමෙහි පැවතිමේ තේජස

"කිස්තුස් වහන්සේ අද දවසේත් ස්වර්ගීය පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ සිංහාසනයේ වාඩිවී සිටිමින් ස්වාධිපත්‍යය ඇතිව මැදහත්කාරකම් කිරීමෙහි පැවතිම මහත් වූ තේජසයි." කියා ඇන්ඩ්‍රෑ මරේ පවසා ඇත. එය අපගේ මහත්වූ තේජාන්විත සේවයටත් යෝග්‍ය වන්නේය. එහිදි අපි ක්‍රිස්තුස් වහන්සේ මෙන් ක්‍රියාකරනවාට වඩා, උන්වහන්සේ සමඟ එක්ව මැදහත්කාරකම් කිරීම උන්වහන්සේගේ හදවතේ ඇති ප්‍රමුඛ අවශ්‍යතාවයයි. කිතුණුවන්ට වෙනත් ක්‍රමයකින් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවට ආශිර්වාදයන් සහ මහත්වූ ශක්තියක් ගෙන ඒමට නුපුළුවන. ක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍යයේ වර්ධනයට සහ ක්‍රිස්තුස් වහන්සේගේ නාමයට මහිමය ගෙනදීමට ඊට වඩා වැඩියෙන් කළ හැකි දෙයක් නොමැත. මැදහත්කාරකම් කිරීමෙහි පැවතිම පොළොව මත ඔබගේ සුවිශේෂ වූ සේවයයි.

යාච්ඤා කිරීමෙහි පැවතිම මහිමාන්විත ව තිබේ. මක්නිසාද එයින් ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ හදවතේ ගැස්ම සමග ඒකාබද්ධ වන්නේය. එමෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ දර්ශනය ඔබ සමග බෙදා ගන්නා නිසා, ක්‍රිස්තුස් වහන්සේගේ ශුද්ධවූ අරමුණු සහ අභිප්‍රායන් ඔබ සමග බෙදා ගන්නා නිසා, ආත්ම ගැන ක්‍රිස්තුස් වහන්සේට ඇති වේදනාව සහ බර ඔබ සමග බෙදා ගන්නා නිසා යාච්ඤා කිරීමෙහි පැවතීම මහිමාන්විත තිබේ. මැදහත්කාරකම් කිරීමෙහි පැවැතිමෙන් ක්‍රිස්තුස් වහන්සේ මෙන් සම්පූර්ණයෙන් සේවය කිරීමට සහ ආත්ම පාලනය කරගැනීමට හැකිවේ. උන්වහන්සේගේ වේදනාව අප සමග බෙදා ගැනීම කරුණු කොට ගෙන පුත්‍රයාණන් වහන්සේගේ හදවතේ මොරගැසීම ඔබ තුල ඇවිලෙන තෙක් ආත්මයාණන් වහන්සේ අපගේ දුර්වලකම්වල දී අපට උපකාර කරන සේක. (රෝම 8 ඃ 26)

ක්‍රිස්තුස් වහන්සේ සමග කඳුළු සැලීමටත්, ක්‍රිස්තුස් වහන්සේ සමඟ ප්‍රේම කිරීමටත්, ක්‍රිස්තුස් වහන්සේ සමග අතිශය උද්‌යෝගයෙන් ඇවිළීමටත්, මැදහත්කාරකම් කිරීම තේජවත්ව (මහිමවත්ව) තිබේ. ක්‍රිස්තුස් වහන්සේ සමග මැදහත්කාරකම් කරමින් සටන් කිරීමට සහ ජයග්‍රහණය බෙදා ගැනීමට එය මහිමවත්ව තිබේ. පැමිණෙන්නා වූ කාලයේ දී මැදහත්කාරකමේ පැවතීම තුල ජයග්‍රහණයේ ප්‍රීතිය සහ බලය ඔබට හැගෙන්නට පටන් ගන්නේය. (හෙබ්‍රෙව් 6 ඃ 5) ඔබගේ යාච්ඤාව අසා පිළිතුරු ලබා දීම ආත්මයාණන් වහන්සේ සහතික කරන බව හැඟේද්දී තේජස පටන්ගන්නේය. ඇසට පෙනෙන්නා වූ ප්‍රතිඵල හැමවිටම ක්ෂණික ව සාක්ෂි වශයෙන් නොපවතින්නේ ය. නමුත් ප්‍රකාශ කර තිබෙන්නාවු දෙවියන් වහන්සේගේ කැමැත්ත මත ඔබ රැඳී සිටින විට පිළිතුරු ලැබෙන බව ඔබ දැන ගනු ලබයි.

යාච්ඤාවේ රැඳී සිටීමේ අවසාන ප්‍රතිඵලය සහ ලෝකයට සමීපවීමට අවශ්‍යවන්නා වූ විශේෂිත වූ මහිමය යාච්ඤා කිරීමට පිළිතුරු වශයෙන් ලැබේ. දෙවියන් වහන්සේගේ අපේක්ෂාවට ගෞරව කරමින් යාච්ඤා කිරීමෙහි රැඳී සිටින්නාවු වීරයන්ට ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චසනය ඉදිරියේ දී ගෞරව කර සදාකාලික වූ ප්‍රතිවිපාකය ලබා දෙනසේක. (1 කොරින්ති 3 ඃ 11-15, 4 ඃ 5, 9 ඃ 25)

ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම සමග සහ මැදහත්කම් කරන්නා වූ අනිත් අය සමග ඔබ රැඳි සිටිනවා දැකීම කොපමණ අනර්ඝව තිබෙනවා ද.....? ඊළඟට සඟවා තිබෙන්නාවු දෙවියන් වහන්සේගේ බලයේ ක්‍රියාකිරීමේ රහස දේවදරුවන් වන ශුද්ධවන්තයන් සොයාගනු ලබනවා ඔබ දකින්නේ ය. එමෙන්ම පුත්‍රයාණන් වහන්සේ කරුණුකොටගෙන පියාණන් වහන්සේව නියෝජනය කිරීම සහ දෙවියන් වහන්සේගේ ශුද්ධවූ දේවදූතයනුත් එකතු කරගෙන ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන ඔබ සමග බෙදාගන්නා වූ දෙවියන් වහන්සේගේ හදවතේ පවතින්නාවූ ශුද්ධවූ මැදහත්කාරකම් කිරීම ඔබ දකින්නට පටන් ගනු ලබන්නෝය. යාච්ඤා කිරීමෙහි පැවතීම නිෂ්ඵල නොවන බව ඔබ දකින්නෝය. පුදුම වූ ප්‍රේමණීය වූ දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබ යටත් විය යුතුය උන්වහන්සේ පිළිබඳව දැඩි භක්තියෙන් ඔබවම යටහත් කරගනිමින් කිස්තුස් වහන්සේ සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීම තුල උන් වහන්සේගේ සිංහාසනයේ සේවයට සහ සදාකාලික ජයග්‍රහනයට ඔබ පංගුකාරයෙක් වන්නේය.

"ස්වාමීනි....., මෙම වරප්‍රසාදය ගැන, වගකීම ගැන සහ යාච්ඤා කිරීමෙහි පැවතීමේ තේස ගැන අපට ඉගැන්නුව මැනව."

"සියළු ශුද්ධවන්තයන් ගැනද, මා උදෙසාද නොකඩවාම සියළු ඉල්ලීම්වලින් අවදිව සිටපල්ලා."(එපීස 6 : 20)

ස්වාමින් වහන්ස..,වැඩිය මැනව අපට ඔබ වහන්සේව මගහැරී ඇත.

රොජර් එල්ස්වර්ත් විසිනි

"ස්වර්ගයේ සිට ඇස් යොමා ඔබගේ ශුද්ධකම සහ තේජසේ නිවාසයේ සිට බැලුව මැනව ඔබගේ ජ්වලිතකම සහ බලවත් ක්‍රියා කොයිද? වා කෙරෙහි වූ ඔබගේ දයාවද, අනුකම්පාද නැවතී තිබේ."

"මක්නිසාද ඔබ අපේ පියාණෙනි. ආබ්‍රහම් අප නොදන්නා නමුත් ඊශ්‍රායෙල් අප නාදුනන නමුත් ස්වාමීන් වහන්ස, ඔබම අපේ පියාණෙනි. අපේ විදුම්කාරයාණෙනි. එය පුරාණයේ සිට ඔබගේ නාමයයි." (යෙසායා 63 ඃ 15 - 16)

යෙසායා අනාගතවකතෘ ඔහුගේ සෙනඟගේ අනාගතය ගැන අනාගතවාක්‍යයෙන් පවසා ඇත. බබිලෝනිවරුන්ගේ පැමිණීම තුල දේශය විනාශ වීම (කොල්ලකෑම) සෙනඟව වහල්කම රැගෙන යාම ඔවුන්ගේ දේශයේ සම්පූර්ණයෙන්ම ගරාවැටුණු (නිසරු) මුඩු බිමක් බවට පත්වන ආකාරය ඔහුට දැකීමට හැකිවිය. වහල් කම තුල සෙනඟගේ ශක්තිය පිරිහීයාම සහ ඔවුන් ආශාකළාවූ ඔවුන්ගේ නිවෙස් වසරක් පාසා වසරක් අඳුරවීමත් ඔහුට දැකීමට හැකිවූයේය. අවසානයෙ දී ඊශ්‍රායෙල් නැවත ඔවුන්ගේ දේශය තුල පිහිටවනු ලබන බව සහ පැමිණෙන්නාවු මෙසියස් වහන්සේගේ සදකාල රාජ්‍යය ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීමේ ලක්ෂණය ද ඔහු දුටුවේය.

මෙම බයිබල් පද වලදී අනාගතවක්තෘ ඔහුගේ සෙනඟගේ පිරිහිම පෙන්වාදෙමින් යාච්ඤා කරන ආකාරය අධ්‍යනය කරමින් අපිත් යාච්ඤා කරමු. ඊශ්‍රායෙල් සෙනඟ බබිලෝනියේ වහල්කමට පත්වීම තුල ඔවුන් මුහුණ දෙන්නා වූ අතිශය අයහපත් වාතාවරණය සහ භයානක අවස්ථාව ගැන ඔවුන්ගේ තොල්වල සහ හදවත්වල තිබෙන්නා වූ යාච්ඤා පිළිබඳව අනාගතවක්තෘට දැකීමට හැකිවිය.

මෙම යාච්ඤාව තුල ඔවුන්ගේ හදවත් සසල කරවන වචන ප්‍රකාශ කරනු ලැබුවෝය.

"විදිරිකාරයන්ට ඔබගේ නාවයේ දන්වන පිණිසද ඔබ ඉදිරියේ ජාතීන් වෙවිලන පිණිසද ඔබවහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැලැවේ දල්වන්නාක් වෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් වෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයන්ටත් යෙදුනොත් හොඳය."

(යෙසායා 64 ඃ 1-2) ඒ සියල්ලට අමතරව ආයාචනා කිරීමට නැවත යොමුවෙනවා හෝ ආයාචනා කිරීම ගලා යනවා ප්‍රකාශ වන්නේය. අපි ආත්මික යුද්ධායුධ වලින් සන්නද්ධ වී යාච්ඤා කිරීමෙහි රැඳී සිටින විට දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සභාව වෙතට නැවත හැරී ඇවිත් ඔවුන්ට බලය සහ ආශිර්වාද ලබාදීමට යොමු කරවන සේක. මෙහිදි වෙන්ව සිටි තම සහකරුවා වෙතට හෝ සිත් රිදිමටලක්ව සිටියා වූ සම්බන්ධතාවයන් නැවත හැරී ඒමට සහ බිඳුණාවූ සම්බන්ධතාවයන් නැවත ගොඩනගා ගැනීමට බලවත් ලෙස අපව යොමුකරනු ලබන්නේය.

අපි යෙසායා අනාගතවකතෘ සඳහන් කර තිබෙන කාරණා අනුගමනය කරන විට එම කාර්‍යයන් වල යෙදීමට උචිතවන්නේ කෙසේදැයි යන හැඟීම අපට දැනෙන බව නිශ්චිතවම අපි දකින්නෙමු. එමෙන්ම අපි උන්වහන්සේගේ ආශිර්වාදය අවබෝධ කරගෙන අපතුල උන්වහන්සේගේ අභිමුඛත්වය නැවත පිහිටුවා යළි පුබුදුවාලනු ලැබීම අපට දැඩි ලෙස උවමනා වන්නේය. මේ මොහොතේදීම යෙසායා අනාගතවකතෘ මෙන්, "ස්වාමීන් වහන්ස..... අහස පලාගෙන වැඩිය මැනව....." කියා මොරගැසීමට ආරම්භ කරමු.

යෙසායා සඳහන් කරන එම කාරණා වලින්ම අපගේ ජීවිතත් සන්නද්ධ කරගෙන දෙවියන් වහන්සේගේ මහත්වූ බලය අප අතරට පැමිණ ක්‍රියාකරන තෙක් නිරන්තරයෙන් සහ ප්‍රබල ලෙස අපගේ හඬ ස්වර්ගය වෙතට ඔසවමු. අපගේ එක්සත් හඬ ගීතිකාවක් මෙන් ස්වර්ගීය දොරටු වෙතට යොමුකරමින්, වර්ෂාවක් මෙන් වැඩිවෙන්නට සලස්වමු. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව පොළොවේ ප්‍රශංසාවක් කරන තෙක් අපේ ජීවිතවලට නිශ්කලංක නොදී සහ දෙවියන් වහන්සේට නිශ්කලංකයක් නොදී මොරගසමු.

"එව්බා යෙරුසලුව, නුඹේ පවුරු පිට මුරකාරයන් සිටෙව්වෙමි. ඔවුහු රෑවත්, දවල්වත් කොහෙත්ම නිශ්ශබ්ද නොවන්නේ ය. ස්වාමීන් වහන්සේට වතක්කාරවන තැනැත්තෙනි, උන්වහන්සේ යෙරුසලුව පිහිටුවා පොළොවෙහි ප්‍රශංසාවක් කරන තුරු නුඹළා නිශ්කලංක නොගනිල්ලා උන්වහන්සේට නිශ්කලංක නොදෙල්ලා." (යෙසායා 62 ඃ 6 - 7)

යෙසායා අනාගතවක්තෘ ඔහුගේ යාච්ඤා කිරීම ආරම්භයේ දී "අහස පලාගෙන බසින්නට යෙදුනොත් හොඳයැයි ප්‍රකාශකර ඇත." ඔහු පැවසුවාවූ කාරණය තුල "ස්වාමීන් වහන්ස....., වැඩිය මැනව. අපි ඔබවහන්සේව මගහැරගෙන ඇත්තෙමු." යන අදහස ඇති බව පෙනෙන්නට තිබේ. ඔබ යම් කෙනෙක්ව මගහැරගෙන තිබෙන්නේ නම් ඔබගේ මනස එම පුද්ගලයාගේ විශේෂ වූ ගති ලක්ෂණ සහ ක්‍රියාවන් වෙතට ඇදී යනවා ඇත. සමහරවිට එම පුද්ගලයාගේ සිනහව හෝ ඔහුගේ ස්පර්ශයකින් දැණුනාවූ උණුසුම ඔබ නැවත මතක් කරමින් සිටිනවා විය හැකිය. සමහර විට එම විශේෂිත වූ පුද්ගලයා ගේ පැමිණීම අගේ කොට සලකමින් සහ සැබෑවටම ඒ තුළ ප්‍රීතිවෙමින් නොසිටීම ගැන ඔබ ඔබටම දෝෂාරෝපණය කර ගන්නවා විය හැකිය. ඒ ආකාරයෙන්ම යෙසායා අනාගතවක්තෘ ප්‍රකාශ කරන ලෙස ඔහුගේ ජාතියේ සෙනඟ දෙවියන් වහන්සේ මඟ හැරගෙන උදාසීනව සිටීමේ වේදනාව පිළිබඳව ඔබට අවබෝධ කරගත හැකිය.

1. දෙවියන් වහන්සේගේ මුහුණේ සිනහව මගහැරී ගෙන ඇත

"ස්වර්ගයේ සිට ඇස් යොමා ඔබගේ ශුද්ධකම සහ තේජසේ නිවාසයේ සිට බැලුව මැනව....." (යෙසායා 63 ඃ 15) කියා යෙසායා පැවසුවේ ය. ඔහු එලෙස ප්‍රකාශ කිරීමට ආරම්භ කිරීමට කිරීම සුදුසු වන්නේ කෙසේද.....? දෙවියන් වහන්සේ ස්වර්ගයේ සිට ඇස්යොමා බලන තෙක් සහ සෙනඟගේ අවාසනාවන්ත තත්ත්වය නිරීක්ෂණය කරන තෙක් සෙනඟට දෙවියන් වහන්සේගෙන් කිසිවක් ලබා ගත නොහැකි බව ඔහු අවබෝධ කර ගත්තේය. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ මුහුණ සෙනඟ වෙතින් ඉවතට හරවා ගැනීමේ ප්‍රතිඵලය පිළිබඳවත් ඔහු අවබෝධ කර ගත්තේය. සෙනඟට තමුන්ගේ ජීවිතය වල ස්වාභාවය අවබෝධ කර ගැනීමට උන්වහන්සේ ඉඩ හැරියේ සේක. දෙවියන් වහන්සේ නැතිව සහ සැලකිල්ලක් නැතිව පාපය තුලට වේගයෙන් දිවයාමෙන් ඉවත්නොවී හැම අතින්ම ආකර්ෂණීය ලෙස සිටීමට තමන්ගේ ජීවිත හසුරුවා ගැනීමට තමන්ට පුළුවන් යැයි ඔවුන් සිතුවෝය.

බොහෝ දෙනෙකුට දෙවියන් වහන්සේගේ මෙම පැමිණීම තිගැස්මක් ඇති කළේය. පොදුවේ පිළිගන්නාවු මතය වූයේ දෙවියන් වහන්සේ ස්වර්ගීය සිංහාසනයේ වැඩ හිඳින බව සහ අපි කිරීමට තෝරාගෙන තිබෙන්නේ මොනවා වුවත් අප මත උන්වහන්සේගේ මෘදු මොළොක් සිනහව පවතින බවයි. සෙනඟ අමතක කර තිබෙන්නාවු දෙවියන් වහන්සේගේ වාසස්ථානයේ ඇති ශුද්ධකම සහ තේජස රැගෙන පැමිණෙන්නැයි යෙසායා පවසන බව අපට හැගෙන්නේ ය. (යෙසායා 63 ඃ 15) අපි පාපය ඉවසන මධ්‍යස්ථ වී මනසක් ඇතිව පාපය විහිළුවකට ගෙන සහ පාපයට අනුබල දෙන තත්වයකට පත්ව සිටිනවා විය හැකිය. නමුත් දෙවියන් වහන්සේ පාපයට විරුද්ධ වෙනස් නොවී එලෙසම පවතින සේක. අපි පාපය සමඟ ගනුදෙනු කරමින්, පාපය සමග පළුදු වූ සම්බන්ධතාවයන් නැවත ගොඩනගා ගැනීම උපරිම වශයෙන් අවධාරණය කර සිටිනවා විය හැකිය. නමුත් දෙවියන් වහන්සේගේ කැමැත්ත කිසිසේත් ඒය නොවේ. අපි පාපය මත තමන්ව සතුටු කරගනිමින් තෘප්තියට පැමිණ සිනහවෙන් ප්‍රසාදය පලකරන විට දෙවියන් වහන්සේ අප සමඟ සිනහවෙන් ප්‍රසාදය පලකිරීම නතර කර උන්වහන්සේගේ මුහුණ අප කෙරෙන් අහකට හරවා ගන්නා සේක.

මෙය ඔබ පුදුමයට පත් කරනවාද.....? එසේ නැතිනම් පුදුමයට පත් කරන්නෙ නැද්ද.....? මෙම කාරණය දෙවියන් වහන්සේගේ සෙනඟගේ ජීවිතවල ඇති පාපය සම්බන්ධව බොහෝ කාලයකට පෙර දෙවියන් වහන්සේ ස්ථාපිත කරතිබූ උන්වහන්සේගේ ප්‍රතිපත්තියයි. ඊශ්‍රායෙල් සෙනඟගේ ඉතිහාසය තුල සැකයක් නැතිව මෙය සිදුවීමට දෙවියන් වහන්සේ ඉඩහැර තිබූ සේක. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ සෙනඟගේ පාපය පිළිබඳව කටයුතු කරද්දී උන්වහන්සේ ඔවුන්ට පොරොන්දු වී තිබුණේ කොහොමද.....?

"ඒ දවසේ මාගේ උදහස ඔවුන්ට විරුද්ධව ඇවිලෙන්නේ ය. එව ඔවුන් අතහැර මගේ මුහුණ ඔවුන්ගෙන් සඟවා ගන්නෙමි. එවිට ඔවුහු කොල්ලයක් වන්නෝය. ඔවුන් පිටට බොහෝ විපත්තිද, දුක් ද පැමිණෙන්නේ ය. ඔවුහු ඒ දවසේ කථාකොට මේ විපත්ති අපි පිටට පැමිණ තිබෙන්නේ අපේ දෙවියන් වහන්සේ අප අතරේ නැති නිසා නොවේදැයි කියන්නෝය. ඔවුන් අන් දෙවිවරුන් වෙතට හැරී යාමෙන් කළාවූ සියලු දුෂ්කම් නිසා ඒ දවසේ දී මාගේ මුහුණ සැඟවින් සඟවා ගන්නෙමි".
(ද්විතිය කථාව 31 ඃ 17-18)

දෙවියන් වහන්සේ අපවෙත සිනහව දක්වමින් ප්‍රසාදය පලකරන බව දැකීමට වඩා ප්‍රමෝදජනක සහ තෘප්තිය ඇති කරන්නාවු වෙනත් දෙයක් නොමැත. එමෙන්ම උන්වහන්සේගේ සිනහව නොමැතිව ජීවත්වීමට වඩා බියකරු සහ අප්‍රසන්න දෙයක් නොමැත. සභාවක් ලෙස ඇගේ කාරණය මෙය නොවේද.....? ඇයගේ සියළු ස්වාභාවයන් කාර්‍යක්ෂම, අනුබල දෙන්නාවූ, ආකර්ෂණීය වැඩසටහන් සහ විනෝදාත්මක දේශකයන් ඇතිව තිබේ. නමුත් එයින් දෙවියන් වහන්සේගේ ආශිර්වාදයේ පූර්ණත්වය සැබෑලෙස පෙනෙන්නේ නැත. මක්නිසාද සභාවේ පාපය කරුණුකොටගෙන දෙවියන් වහන්සේගේ වේදනාවට පත්ව උන්වහන්සේගේ මුහුණ ඔවුන් වෙතින් අහකට හරවාගෙන තිබෙන සේක. එබැවින් දයාවේ දෙවියන් වහන්සේ, කරුණාවේ දෙවියන් වහන්සේ වන ස්වාමීන් වහන්සේගේ මුහුණේ දීප්තිය දකින පිණිස මැදහත්කාරකම් කරන්නාන් සමග අපි එක්ව යාච්ඤා යෙදී සිටිමු.

මෙම හේතූන් නිසා දෙවියන් වහන්සේගේ සිනහව මගහැර ගෙන ඇති බව එකතුකර යෙසායා අනාගතවකතෘ අනාවරණය කරන්නේය.

6 පිටුවට

5 පිටුවෙන්

ස්වාමින් වහන්ස..,වැඩිය මැනව ...

2. දෙවියන් වහන්සේගේ උපකාරයේ හස්තය මගහැරගෙන ඇත

ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන් නැවත නැවත දෙවියන් වහන්සේ උන්වහන්සේගේ බලය පෙන්වා තිබෙන සේක. ඒ හේතුවෙන් අනාගතවක්‍යත මෙම යාච්ඤාවට ඇතුල් වීමට පෙර ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන් කළාවූ දෙවියන් වහන්සේගේ මහත් වූ බලය අනාවරණය කිරීම දෙස බලන්නේය. ආශ්චර්‍යමත් ලෙස ඊශ්‍රායෙල් සෙනඟව රතු මුහුදු දෙබෑකරමින් ඵාරාවෝ සහ ඔහුගේ හමුදාව අතින් ගැළවී යාමට හැකියාව ලබාදුන් සේක. (යෙසායා 63 ඃ 11-14)

මෙහිදී යෙසායා අනාගතවක්තෘ දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් සෙනඟට ලබා දෙනනාවූ උන්වහන්සේගේ බලය වළක්වා තිබුණ බාදු ඉවත් කිරීමට ක්‍රියා කළේ නැත. නමුත් පෙනෙන පරිදි අනාගතයේ දී ඊශ්‍රායෙල් සෙනඟ ලබන්නට යන්නාවූ පරාජය (අසාර්ථක වීම) ගැන, අලංකාර වූ දේව මාළිගාව ගල් ගොඩක් වීම ගැන, බබිලෝනියේ වහල්කමට රැගෙන යන සෙනඟගේ මොරගැසීම විශාලත්වය ගැන කල්පනා කළේය. හදිස්සියේම එක් ප්‍රශ්ණයක් ඔහුගේ කල්පනාවට නැගෙන්නේය. එනම්, දෙවියන් වහන්සේ කොහිද.....? (යෙසායා 63 ඃ 11) එමනිසා ඔහු මෙලෙස යාච්ඤා කිරීමට පැමුණුනේය. ඔහු ඉක්මනින් දෙවියන් වහන්සේගෙන් මෙසේ අසා සිටියේය. **"ඔබගේ ජ්වලිතකම සහ බලවත් ක්‍රියා කොහිද.....?** (යෙසායා 63 ඃ 15) කලින් බොහෝ අවස්ථාවලදී ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන් දැක්වූවාවූ දෙවියන් වහන්සේගේ ශක්තිය සහ බලය ප්‍රකාශ වෙන්නට සළස්වන්නේ නැතිව ඊශ්‍රායල්ව විනාශවීමට අත්හැර දමා ඔවුන්ගෙන් ඇත්ව සිටින්නේ ඇයි කියා යෙසායා අසන්නේය.

ලෝකයේ මානුෂ්‍යයන් නිතරම අපහාසාත්මකව ඔවුන්ගේ දෙවියන් වහන්සේ කොහිදැයි දෙවියන් වහන්සේගේ සෙනඟගෙන් අසති. (ගීතාවලිය 42 ඃ 3, 10, 79 ඃ 10, 115 ඃ 2) නමුත් කනගාටුදායක දේ නම් දෙවියන් වහන්සේගේ සෙනඟ තමන් ගෙන්ම මේ ප්‍රශ්නය අසා ගනු ලැබීමයි. පිළිතුරු සපයාදීම් නොපෙනෙන විටදී වුවත් සතුටු වීමට අපට පුළුවන් නම් ඒ කරුණු කොට ගෙන දෙවියන් වහන්සේගේ බලය ප්‍රකාශ කිරීමට අපි යොමුවන්නෙමු. නමුත් දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන බලය අපට ලැබීම වැළකී තිබෙන විට අපට යම්කාර්‍යයන් ඉටුකිරීමට සහ සාක්ෂියක් ප්‍රකාශකිරීමට යොමු විය හැකිද.....?

දෙවියන් වහන්සේගේ බලය ලබාගෙන තිබෙන විට සභාව කරන්නා වූ දේවලදී ලෝකය තුල විශ්වාසවන්තකම පවත්වාගෙන යා හැකිවේ. සභාව මහත්වූ ආත්මික යුද්ධයක යෙදී සිටිති. එයින් ජය ගැනීමට හැකි වන්නේ දෙවියන් වහන්සේගේ බලය කරුණුකොටගෙන පමණක් වේ. මානුෂ්‍යයාගේ නව නිර්මාණය සහ ප්‍රඥාවේ ක්‍රියාවන් කිසිසේත් ඊට සමාන කළ නොහැකිය. දෙවියන් වහන්සේගේ බලය නොමැතිව උත්සහ කරන්නා වූ එබඳු කාර්‍යයන් නිරායුධදෑත් වලින් විශාල කළුගල් පර්වත බිඳ දැමීමට උත්සාහ කරන්නාක් මෙන් වේ.

සභාව තමන්ගේම බලය මත රඳා පැවතීමට උත්සාහ දැරීම සහ තමන්ගේම හැකියාව කෙරෙහි බලාපොරොත්තුවීම එහි ඇති ප්‍රශ්ණය ලෙස මම දකින්නෙමි. මනුෂ්‍යය ප්‍රඥාවෙන් බොහෝ දේවල් නිපදවිය හැකිය. දෙවියන් වහන්සේගේ හස්තයෙන් ඉවත්ව යන ලෙස සභාව මෙයින් තමාවම රවටා ගැනීමට ලක්ව සිටිති. එබැවින් ලෝකයට සභාවේන් ලබාගැනීමට (ග්‍රහණය කර ගැනීමට) කිසිවක් නැත. එමනිසා **".....ඔවුන්ගේ දෙවියන් වහන්සේ කොහිදැයි....."** ලෝකයේ අය අසමින් සභාවට අපහාස කරනු ලබති. අපි අපගේ හදවත් සෝදිසි කරමින් අපි යොමු වී සිටින්නාවු වැදගැම්මකට නැති සහ අශෝභන කාරණා වෙනුවට සැබෑ වූ දෙවියන් වහන්සේගේ බලය ප්‍රකාශ කිරීමට සහ දෙවියන් වහන්සේට මොරගැසීමට යොමුවෙමු. අවසානයේ දී යෙසායා සඳහන් කරන ලෙස යාච්ඤා කිරීමට විවෘත වෙමු. **"ඔබගේ ජ්වලිතකම සහ බලවත් ක්‍රියා කොහිද.....?"** (යෙසායා 63 ඃ 15)

3. දෙවියන් වහන්සේගේ හදවතේ ඇති කරුණාවන්ත රුකබලා ගැනීම අතපසු කරගෙන ඇත්තෙමු

යෙසායා අනාගතවක්තෘ මෙලෙස අසා සිටියේය. **"ඔබගේ ජ්වලිතකම සහ බලවත් ක්‍රියා කොහිද.....? මා කෙරෙහි වූ ඔබගේ අනුකම්පාවද නැවතී තිබේ."** (යෙසායා 63 ඃ 15) මෙම වාක්‍යයෙන් ප්‍රකාශ කරන හෙබ්‍රව් ප්‍රකාශය තුලින් අවුරුද්ද පුරාම හදවතේ අපේක්ෂා කරන දේ හඟවා දෙන්නේය. මුළු වර්ෂය සඳහාම හදවතින්ම දයානුකම්පාව අපේක්ෂා කරනු ලබයි. නියත වශයෙන්ම සිදුවෙන්නාවු කාරණයක් යෙසායා අසා සිටියේය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මුහුණ හරවා ගන්නේනම් සහ උන්වහන්සේගේ ශක්තිය වළක්වා තිබීමෙන් අදහස් කරන්නේ දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ දරුවන්ට බොහෝ කාලයක් ප්‍රේම නොකර සිටින බවද.....? යෙසායා මේ පිළිබඳව මුල පිරීමට හේතුව ලෙස මාංශිකව ආබ්‍රහම් සහ යාකොබ් ඔවුන්ගේ පියවරුන් ය. නමුත් දෙවියන් වහන්සේ ඔවුන්ගේ පියාණන් වහන්සේ ව සිටින බව ක්ෂණිකවම යෙසායා අවබෝධ කරගත්තේය. තමන්ගේ මහත්වූ පාපය නිසා ඔවුන්ගේ (ඊශ්‍රායෙල් සෙනඟ) එය පිළිගැනීමට කැමැති වූයේ නැත. නමුත් දෙවියන් වහන්සේගේ නාමය සදාකාලික වේ. තවත් ආකාරයකින් පවසන්නේනම් උන්වහන්සේගේ ස්වභාවය තුල උන්වහන්සේ ස්ථිරවම පවතින සේක. දෙවියන් වහන්සේගේ වෙනස් නොවන්නාවූ චරිතය නිසා ඊශ්‍රායෙල් සෙනඟට ඔවුන්ගේ පාපය ගැන පසුතැවිලි වනවිට උන්වහන්සේ සමාව ලබාදෙන බව යෙසායා අවබෝධය කරගත්තේය. එම අවබෝධය නිසා මෙලෙස යාච්ඤා කිරීමට යෙසායාට ධෛර්‍යය ලැබුණේය.

මෙහි ඇති මහත් වූ සත්‍යතාවය වනුයේ අපව නොසලකා හැර නොමැති බවයි. අපි පාපය තුල සිටින විටත් දෙවියන් වහන්සේ අපට දක්වන්නා වූ ප්‍රේමය නතර වී නැත. නමුත් උන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කිරීම වළක්වා තිබෙන සේක. ඒ දෙස බලා දෙවියන් වහන්සේ අපට නැවත ප්‍රේම නොකරන සේකැයි සිතීමට අපි පැමිණ සිටින්නෙමු. දෙවියන් වහන්සේ තවමත් අපට ප්‍රේම කරන බව අපි තර්ක කරමින් සහ ඔප්පු කරමින් සිටිනවා විය හැකිය.ඒවැනි තර්ක කිරීම් යහපත් සහ අනර්ඝව තිබේ. නමුත් ඒවා දෙවියන් වහන්සේගේ ප්‍රේමය විඳහා දැක්වීමට ප්‍රකාශ කිරීමට ආදේශකයක් වන්නේ නැත. එසේ නම් දෙවියන් වහන්සේගේ ප්‍රේමය බහුලත්වය හස්තය ප්‍රකාශ වීමට සූදානම්ව තිබීම සහ අපගේ ජීවිත කෙරෙහි ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඔප්පුකර දක්වන්නේ කෙසේද.....?

යෙසායාගේ යාච්ඤා කිරීම ආරම්භ කිරීමේ වචනවලදී අපගේ ජීවිත කෙබඳු විය යුතුදැයි අපට මතක්කර දෙන්නේය.දෙවියන් වහන්සේගේ සිනහාවෙන් ප්‍රසාදය පලකිරීම, දෙවියන් වහන්සේගේ බලය දකින්නට සැලස්වීම සහ දෙවියන් වහන්සේගේ ප්‍රේමය තුල තෘප්තිමත්වීම පිළිබඳව අවබෝධ කරගත යුතුය. ජීවිතයේ පැවැත්ම සඳහා එම ක්‍රියාමාර්ගට වඩා මහත් දෙයක් නොමැත.එමෙන්ම මෙම කාරණා අතපසුකරගෙන තිබෙන නිසා කොපමණ බිහිසුණු දේවලට මුහුණ දෙනවා දැයි අපි නැවත අවබෝධ කරගත යුතුයි. අප අතරේ බෝහෝ දෙනා ඔවුන් (එදා ඊශ්‍රායෙල් සෙනඟ) මෙන්ම මුලාවී සිටින්නෝය. එබැවින් අපි බොහෝ පහළ තත්ත්වයෙන් ජීවත් වන්නෙමු. මෙම කාරණය තුල පවතින තත්වය නම් අපි නතර වී සහ මහත් වූ කාරණා ගැන සිතීම මගහැරගෙන ඇත. එබැවින් දෙවියන් වහන්සේට මෙලෙස යාච්ඤා කරමින් මොරගැසීමට ආරම්භ කරන්න.

"අහෝ ඔබගේ විඳිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියේ හි ජාතීන් වෙවුලන පිණිසද, ඔබවහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැලෑව දල්වන්නාක් මෙන්ද, ගින්න වතුර උතුර වන්නාක් මෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයන්ටත් යෙදුනොත් හොඳය." (යෙසායා 64 ඃ 1 - 2)

5 පිටුවෙන්

දෙවියන් වහන්සේට මැදහත්කරුවන්ව අවශ්‍යව තිබෙන සේක..

(ඩෙනිස් කින්ලෝ විසිනි)

සත්‍යතාවයට ප්‍රේමකරන්නාවූ, ධර්මිෂ්ඨකම් කරන්නාවූ එක් මනුෂ්‍යයෙක් සොයාගැනීමට පුළුවන්නම් දෙවියන් වහන්සේ මුළු යෙරුසලමේ පාපය ගැන ඊට කමාවනසේකැයි උන්වහන්සේ පැවසුසේක. (යෙරමිය 5 ඃ 1)

දේශයේ විනාශ නොකරන පිණිස පවුරක් ගොඩනගා කඩුල්ලෙහි සිටින පිණිස දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙක් සොයන බව එසකියෙල් 22 ඃ 30 වන පදයේ සඳහන් වේ.

යෙසායා අනාගතවක්තෘ තුලින් උන්වහන්සේ මෙසේ පවසන සේක. **"එසේය, සැබෑකම ඇත්තේ නැත. නපුරෙන් පහවෙන්නාද කොල්ලයක් වන්නේය. ස්වාමින් වහන්සේ ඒ දැක යුක්තිය නැති බැවින් අප්‍රසන්න වුසේක. උන්වහන්සේද කිසිවෙක් නැති බව දැක මැදහත්කාරයෙක් නැති බැවින් පුදුමවූ සේක. ඒ නිසා උන්වහන්සේගේම බාහුව තමන්වහන්සේට ගැළවීම ගෙනායේය. උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්වහන්සේව ඉසුලුවේය."** (යෙසායා 59 ඃ 15 - 16)

එක් මනුෂ්‍යයෙකුට වෙනසක් ඇති කිරීමට හැකිද...? දෙවියන්වහන්සේට අවශ්‍යවන්නේ කෙබඳු ආකාරයෙන් පුද්ගලයෙක්වද...? මැදහත්කාරකම් කරන කෙනෙක් හෝ මැදහත්වන්නාවූ කෙනෙක්ව දෙවියන් වහන්සේ බලා සිටින සේක. එහිදී පාවිච්චි කර තිබෙන හෙබ්‍රෙවූ වචනයේ පදනම මුණ ගැසීම හෝ අභිමුකයේ සිටීම වන්නේය. එමනිසා වෙන්ව සිටින්නාවූ දෙදෙනෙකුගේ කාරණා විසඳීම වෙනුවෙන් මැදහත්වන්නාවූ කෙනෙක්ව දෙවියන් වහන්සේ සොයන සේක.

උන්වහන්සේ අපව සම්බන්ධ කරගෙන සභාවට අවශ්‍ය වන්නාවූ උන්වහන්සේගේ විශ්මය ජනක පිළිතුර ලබාදීමට ක්‍රියාකරන්නේ කෙසේද...? සභාවේ අවශ්‍යතාවයන් වෙනුවෙන් දෙවියන් වහන්සේට පිළිගැනීමට හැකි ආකාරයෙන් මැදහත්කාරකම් කිරීමට කෙනෙකුව සොයනසේක.

7 පිටුවට

"මක්නිසාද, ස්වාමිනී, මම ඔබ කෙරෙහි බලාසිටිමි. මාගේ දෙවි වූ ස්වාමිනි, ඔබම උත්තර දෙනසේක." (ගීතාවලිය 38 : 15)

6 පිටුවෙන්

දෙවියන් වහන්සේට මැදහත්කරුවන්ව ...

දෙවියන් වහන්සේගේ බර දරාගැනීමට ඔහුව සම්බන්ධ කරගන්නා සේක.

එම් කම්වෙල් පිළිබඳ සිදුවීමක් ඔබ සමග පැවසීමට මට ඉඩදෙන්න. 1895 දී බිත්‍යනය මිෂනාරිවරියක් ලෙස ඇය ඉන්දියාවට ගියේය. ඉන්දියාවේදී පුජනිය ස්ථාන වල සිටියාවූ ගැහැණු ළමයින් පිළිබඳව ඇය හොඳ අවබෝධයක් ලබාගත්තාය. යම් පවුලක පියා මරුණුවිට ඔවුන් ඔහුගේ භාර්යාවත් ඔහුගේ දේහය සමග ආදහනය කරනු ලබන්නෝය. මක්නිසාද ඊළග ආත්මයේදී ඔහුට සේවය කිරීමට ඇයව අවශ්‍ය යැයි ඔවුන් විශ්වාස කළෝය. එවිට දෙමව්පියන් නැතිව දරුවන් ඉතිරි වන්නෝය. පිරිමි ළමයින් ආදයමක් උපදවන නිසා ඔවුන්ට ප්‍රශ්නයක් නොවීය. නමුත් ගැහැණු දරුවන්ව අවශ්‍ය වුයේ කාටද...? ගැහැණු දරුවන්ගේ වගකීම භාර ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවූ නිසා ඔවුන් ගැහැණු දරුවන්ව දෙව්වරුන්ට භාරදෙන්නේය. ඔවුන් ගැහැණු දරුවන්ව පුජනීය ස්ථානයක යෝමු කරති. එම දරුවන් ගණිකාවන් බවට පත්වේ. පුජනීය ස්ථානවල ගණිකා වෘත්තියේ යෙදෙන්නාවූ වයස අවුරුදු දොළහයේ හෝ දහතුනේ ගැහැණු දරුවන් ගැන එම් කම්වෙල්ගේ හදවත වේදනාවෙන් පිරුණේය. ඔවුන්ව එයින් මුදාගැනීමට ඇය කටයුතු කාළය. සමහර දරුවන්ව එසේ මුදාගැනීමට ඇයට හැකිවිය. එය පුජනීය ස්ථානවල සිටියාවූ පුජකයන්ගේ අවධානය යොමුවීමට තරම් බලපෑමක් ඇති කළේය. එමනිසා පුජනීය ස්ථානවල පුජකයන් ඉන්දියානු ව්‍යාපාරිකයෙකු වෙතට මෙම ගැටළුව රැගෙන ගියෝය. ඉන්දියානු ව්‍යාපාරිකයා බ්‍රිතාන්‍යය ව්‍යාපාරිකයෙකු වෙතට ගොස් නිර්මාණය වී ඇති මෙම ප්‍රශ්ණය පැවසුවාය. බ්‍රිතාන්‍යය ව්‍යාපාරිකයා, බ්‍රිතාන්‍ය මිශනාරිවරුන් වෙතට ගොස් ඉන්දියානු පුජකයන්ට ඇති වී තිබෙන මෙම ගැටළුව පැවසීය. බ්‍රිතාන්‍යය මිශනාරිවරුන් එම් කම්වෙල් වෙතට පැමිණ මේ කාරණය ගැන ඔබ නිහඩ විය යුතු යැයි කියා කීවෝය. මේ ගැහැණු ළමයින්ට කරන්නේ කුමක්දැයි ඇය ඇසුවාය. මේ බේදවාචකයක් වුවත් ඔබ කරන්නේ පුජනීය ස්ථානයේ පුජකයන්ට ප්‍රශ්ණ ඇති කරන්නාවූ හානිදයක කාරණයක් වන්නේය. එම නිසා ඔබ මෙය නතර කල යුතු යැයි කීවෝය.

ඒ අවස්ථාව වන විට ගැහැණු දරුවන්ව පුජනීය ස්ථාන වලින් පිටතට ගැනීමට කටයුතු කරමින් සිටියාය. පුජනීය ස්ථානයේ ප්‍රධාන පුජකයා ආගමික මනුෂ්‍යයෙකු නිසා ඔහු ශිෂ්ටසම්පන්න සහ අනුකම්පව සහිත පුද්ගලයෙක් යැයි ඇය සිතුවාය. නමුත් ඇය ඔහුගේ මුහුණ දෙස බලද්දී කළුගලක් මෙන් සහ ඔහුගේ දෑස් කෲරව තිබෙන බව ඇය අවබෝධ කරගත්තාය. මෙම ගැහැණු ළමයින් ගෙනදෙන්නාවූ මුදල් නිසා ඔවුන්ව නිදහස් කිරීමට ප්‍රධාන පුජකයා ක්‍රියා කළේ නැත. එබැවින් සියළු දෙනාම තමාට විරුද්ධව සිටින බව ඇය දුටුවය. ඇය ඇගේ කාමරය වෙතට ගොස් එක් මිශනාරීවරියක් හැටියට ඇගේ දණින් වැටී දෙවියන් වහන්සේට මෙසේ පැවසුවාය. "දෙවියන් වහන්ස...., මෙය මගේ ප්‍රශ්ණයක් නොවේ. මම දන්නාවූ සියළුම දේ කළෙමි. එයින් කිසිවක් සිදු නොවීය, මෙය මගේ ප්‍රශ්නයක් නොවේ."

හදිස්සියේම ඇය ස්වාමීන් වහන්සේව දුටුවාය. උන්වහන්සේ මැදපෙරදිග කලාපයේ තිබෙන ඔලීව ගසක් යට දණින් වැටී සිටියේ නැත. නමුත් උන්වහන්සේ ඉන්දියානු ගසක්යට දණින් වැටී සිටිසේක. උන්වහන්සේ දණින් වැටී සිටි අතර උන්වහන්සේගේ දෑස් වලින් පැමිණි කඳුළු මුහුණ දෙපැත්තෙන් ගලාගියේය. ක්ෂණිකවම උන්වහන්සේ සිත පසාරු කරගෙන යන ලෙස එම් දෙස බලා සිටි සේක. උන්වහන්සේ එමීට මෙලෙස පැවසූ සේක. "එමී..., මෙය ඔබගේ ප්‍රශ්ණයක් නොවේ. එය මගේ ප්‍රශ්නයකි. මට එය දරා සිටීමට උපකාර කරන්නා වූ කෙනෙක්ව මම සොයන්නෙමි."

"සැබැවින්ම උන්වහන්සේ උසුලාගත්තේ අපේ දුක්ය. දරාගත්තේ අපේ ශෝකය. එසේවී නමුත් උන්වහන්සේ දසුවමද දෙවියන් වහන්සේගෙන් පහර්ද, පීඩාවද ලැබූ කෙනෙකු යැයි අපි සිතුවුව." (යෙසායා 53 : 4) යේසුස් වහන්සේ කිසිවෙකුගේ අවධානයට යොමු නොවුන්නාවූ අය දෙස දෑස් යොමුකරන සේක. දෙවියන් වහන්සේ සොදොම සහ හොමෝරාව විනාශ කිරීමට පළමුවෙන් ආබ්‍රහම් දෙවියන් වහන්සේ ඉදිරියේ සිටිමින් බලපෑමකින් යුතුව ප්‍රකාශ කල දෙය මතකයට නාගා ගන්න. මම කරන්නට යනදේ ආබ්‍රහම් සමග බෙදා ගන්නෙමියි උන්වහන්සේ කී සේක. (උත්පත්ති 18 : 17) ආබ්‍රහම් මැදහත්කාරකම් කිරීමට යොමුකල සේක.

ඕනෑම කෙනෙක් ඔහුගේ හෝ ඇයගේ ප්‍රශ්ණය මගේ (තමාගේ) ප්‍රශ්ණය කරගෙන, මම එය උසුලාගෙන යමින් එහි වගකීම දරාගන්නෙමියි පවසන විට පමණක් බලාපොරොත්තුව ඇතිවේ. සෑබෑවටම එහිදී සිදුවන්නේ කුමක්ද....? එය මගේ ප්‍රශ්ණයක් නොව, එය දෙවියන් වහන්සේගේ ප්‍රශ්ණයකි. ඔබගේ හදවත තුල ඔබ බරක් දරාගන්නේය. ඔබට නිශ්චලව නිදාගැනීමට නුපුළුවන.රාත්‍රියේදීත් ඔබ වැඩකරනවා ඔබට දැනෙනවා ඇත. ඔබ දරුවන් ගැන, සභාව ගැන, මිත්‍රයන් සහ දේශයේ ගැන ගැඹුරු ලෙස සැලකිල්ල දක්වනවා පෙනෙන්නේය. එය බරදරාගැනීමයි. නැති වී සිටින්නාවූ ලෝකය වෙනුවෙන් දෙවියන් වහන්සේගේ හදවතේ ඇති බර ඔබගේ හදවතට ඇතුලත් කර ගැනීමේ වරප්‍රසාදය දී තිබෙන සේක. රෝම යැවුම් පත්‍රයෙදී රෝමවරුන්ට කතාකරන විට වචනයෙන් විස්තර කල නොහැකි ශුද්ධාත්මයාණන් වහන්සේගේ බර දරාගැනීම ගැන ප්‍රකාශකර තිබේ. (රෝම 8 : 26 - 27) වචනයෙන් විස්තර කල නොහැකි දෙවියන් වහන්සේගේ හදවතේ ඇති වේදනාව තුලට උන්වහන්සේ ඇතුලත්ව සිටිනසේක. මට ඊට ඇතුලත් වීමට උන්වහන්සේ අවස්ථාව ලබදෙනසේක. උන්වහන්සේගේ ශෝකය තුලට ඇතුලත් වීමට මට වරප්‍රසාදය ලබා දෙන සේක. එවැනි පොරොන්දු ඒ තුල තිබේ.

එය මගේ බරයි. මම එය බෙදාගැනීමට කෙනෙක්ව සොයන්නෙමියි දෙවියන් වහන්සේ එමි කාම්වෙල්ට පැවසූසේක. යම් ක්‍රියාමාර්ග වලදී හෝ මැදහත්කරුවන් වන අනිත් අයට උපකාර කිරීමේ ක්‍රියාවලට විවෘතවිම උදෙසා අනිත් පුද්ගලයන් වෙතට දෙවියන් වහන්සේගේ ප්‍රේමය අප තුලින් ගලා යා යුතුය. යාච්ඤා මැදහත්කාරකම් කරන්නාවූ පුද්ගලයාව දැනගෙන නොසිටීම සැබෑකාරණයකි. දේව රාජ්‍යයට කිසිවෙකුට තනියම පැමිණිය නොහැකිය, සම්බන්ධතාවයන් ජාලයක් තුල අපි පැමිණෙන්නෙමු. දෙවියන් වහන්සේට මැදහත්කරකමේ යෙදෙන ඇයව අවශ්‍යව තිබෙන සේක. මැදහත්කරුවන් වන්නේ කවුද....?

---

2 පිටුවෙන්

"මම ඔවුන් අතරේ මනුෂ්‍යයෙකුව සෙවීම්....."

නොසලකා ඉදිරියට ගමන්කිරීම ඇදහිල්ලෙන් අදහස් වේ. සාවුල් රජතුමා ද්‍රාවිත්ට අනතුරු අඟවන විට ඔහු එයට ඇහුම්කන් දීම ප්‍රතික්ෂේප කරමින් ඉදිරියට ගිය බව දේව වචනයේ අපට පවසා ඇත.

"සාවුල්ද වේ පිළිස්තියයාට විරුද්ධව ගොස් ඔහු සමග සටන් කිරීමට නුඹට බැරිය. මක්නිසාද නුඹ තරුණයෙක්ය. ඔහු වනාහී තරුණ, වයස පටන් යුද්ධකාරයෙක්ව සිටින්නේ කැයි දාවිත්ට කිවේය." (1 සාමුවෙල් 17 : 33)

එමනිසා ඇදහිල්ලේ කරුණුකොටගෙන ප්‍රකාශ කරනු ලබන්නේ "දෙවියන් වහන්සේ පවසන විට මම ඉදිරියට යන්නෙමි...." දෙවියන් වහන්සේ ඉටුකිරීමට මාව කැඳවන සියළු දේ සම්පුර්ණ කිරීම සඳහා උන්වහන්සේ මට බලය ලබා දෙන බව මම විශ්වාස කරමි. මම මෙහි සිටින්නේ විශ්වයේ මැවුම්කර දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතුව වන්නෙමි. උන්වහන්සේගේ ස්වරූපයෙන්ම මාව නිර්මාණය කළාවූ දෙවියන් වහන්සේ මගේ සිතට කථාකරනසේක. මාගේ ජීවිතයෙන් ආශ්චර්‍යමත්දේ සිදුවන පිණිස මම උන්වහන්සේව විශ්වාස කරමින් ඉදිරියට යන්නෙමි කියාය."

හෙබ්‍රෙව් කතුවරයා තවදුරටත් මෙසේ පවසා ඇත. **"නමුත් අදහිල්ල නැතුව උන් වහන්සේව ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන් වහන්සේ වෙතට ළඟා වෙන්නා විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත් උන්වහන්සේ සොයන්නාට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්නට ඕනෑය."** (හෙබ්‍රෙව් 11 : 6) ඇදහිල්ල නොමැති නම් දෙවියන් වහන්සේ අපේ සභාව ගැනවත්, අපේ බයිබල් අධ්‍යනය ගැනවත් අපේ යාච්ඤාව ගැන වුවත් සතුටු නොවන සේක. මේ කාරණා ඉතා වැදගත්ව තිබෙන නමුත් ඇද හිල්ල නැතිව දෙවියන් වහන්සේව සතුටු කිරීමට නුපුළුවන. මේ සියළු කාරණා අපගේ ස්වාභාවික මනසට දැනෙන ආකාරයට නොව ඇදහිල්ල කරණුකොටගෙන ඉටු කරමින් දෙවියන් වහන්සේගේ සැලැස්මට යොමුවිය යුතුය.

මෙම ඉල්ලීම ඉටුකිරීමට කැමති කවුද...

"මම මනුෂ්‍යයකුව සෙවීම්....." ස්වාමීන් වහන්සේ පවසන දේ මෙලෙස තේරුම් ගන්න. මම දයාවෙන් පූර්ණව සිටින බව විශ්වාස කිරීමට මනුෂ්‍යයෙකු සෙවීම්. කමන්ගේ ජීවිතවලින් ආශ්චර්‍යමත් දේ කිරීමටත් මට පුළුවන් බව විශ්වාස කරන්නාවූ මනුෂ්‍යයෙකු සෙවීම්.

මේ පැයේදීත් නැවත වාරයක් දෙවියන් වහන්සේ එලෙසම කෙනෙක්ව සොයමින් සිටින සේක. ප්‍රශ්ණය වන්නේ එසකියෙල්ගේ දවස්වලදී සිදුවී තිබුණ ස්වාභාවය නැවත අපේදවස්වලදීත් සිදුවෙමින් පවතින බව අපි දකිනවා ද.....? මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ දයාවේ කාලයක් නොමැති ව විනිශ්චය වෙතට ගමන් කරනවා ද ක්‍රිස්තුස් වහන්සේගේ මේ වස්තුව උදෙසා උන්වහන්සේගේ ජීවනය බලය, දයාව ඉටු කිරීමට යම් ස්ථානයක සිටි ගැනීමට යම් කෙනෙක් කැමතියි ද...

සමහරවිට රි කැමති වේ. නමුත් එය පුදුමයකි. මම මේ වස්තුව උදෙසා අමාරු දෙයක් ගෙවීමට තිබෙද්දී ඒය මිලදී ගන්නේ කෙසේද....එසේනම් දෙවියන් වහන්සේ යෙසායා අනාගතවකතෘට කථා කරමින් ඇදහිය නොහැකි උන් වහන්සේගේ ආරාධනාව ලබාදීම පිළිබඳව සැලකිල්ල යොමු කර බලන්න.

එව්බා පිපාසා ඇති සියල්ලෙනි, වතුර ලඟට වරෙල්ලා. වුදල් නැත්තෙනි, නුඹළාත් ඇවිත් ධාන්‍ය අරන් කාපල්ලා. එසේය. ඇවිත් විල වුදල් නැතුව වුදිකපානය ද, කිරිද ගනිල්ලා (යෙසායා 55 : 1).

මෙය දෙවියන් වහන්සේගේ හඬ ගැසීමයි. (මොර ගැසීමයි) අපගේ හැකියාව හෝ ශක්තිය දෙස දෙවියන් වහන්සේ නොබලන සේක. ස්වාමීන්වහන්සේ මෙන්න මම මෙහිය. ඔබවහන්සේගේ බලය සහ දයාව අනිත් අය සමග බෙදා ගැනීමට මාව යැව්ව මැනව කියා පවසන්නාවූ හදවත් ඇති අය උන්වහන්සේ බලා සිටින සේක මම මානසිකව සෙවීම් කිසිවෙක් මට සම්බන්ධ නූනේය. කියා අපේ නගරය ගැන කියන්නට දෙවියන් වහන්සේට ඉඩ හැර ඇදහිල්ලෙන් නැගී සිටීමට අපට කාලය පැමිණ ඇත අපට ඇති කුඩා දේ තුළින් මේ පරම්පරාව වෙනස් කිරීමට දෙවියන් වහන්සේ අප පාවිච්චි කරන බව විශ්වාස කරමින් උන්වහන්සේ කැඳවන්න වූ කාරණය සම්පූර්ණ කරමු...

Reg. No: QD/NEWS/15/2022
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

ජයගැනීම උදෙසා සන්නද්ධ කරනසේක.

(චාර්ල්ස් අෂර් විසිනි)

ශාරීරික (භෞතික) ශක්තිය සක්‍රිය වන විට ආත්මික ශක්තිය අත්හිටවීම මත රැඳී සිටියි.නමුත් නිරාහාරව සිටීම කරුණුකොටගෙන භෞතික ශක්තිය තාවකාලිකව නතර කිරීම මත රැදිසිටීමෙන් අත්මික ශක්තිය සක්‍රිය වන්නේය.

"නොයෙක් විට නිරහාරව සිටි බව..." අපෝස්තුළු **පාවුල් පවසා තිබේ.** (2 කොරින්ති 11: 27) **"නමුත් මගේ ශරීරය දවනය කර වහල්කම පවුත්වමි. එසේ කරන්නේ අනුන්ට දේශනා කළාට පසු කොයි ලෙසකින්වත් මාව එපා කරනු නොලබන පිණිසය."** (1 කොරින්ති 9 : 27)

ජයග්‍රාහී කිතුණු ජීවිතයකට ශරීරය ආරක්ෂා කරගැනීම ඇත්තටම අවශ්‍යව තිබේ. ප්‍රවේශම් රහිතව ආහාර ගැනීමෙන් මාංශික ශක්තිය උපද්දනු ලබයි.ආහාර පාන ගැනීමට වඩා වැඩි දෙයක් කිරීම ආත්මික ජීවිතය සඳහා අවශ්‍යය බව බොහෝ දෙනා අවබෝධ කරගෙන සිටිති.

නිරහරවා සිටින්නාවූ කෙනෙකුට නිරහාරව සිටීමේ නිසිතත්වය ජීවිතයට ගෙනදෙනු ලබයි. ඔහුගේ ශරීරයේ නිසරු නොකරන නමුත් නිවැරදි ශක්තිය ජනනය කර සාමාන්‍ය තත්වය පවත්වා ගනිමින් ආත්මයට ගෞරවය ලබාදීම තුල ශරීරය සහ ප්‍රාණය සතුටු කරනු ලබයි. ශරීරය සඳහා ඇත්තටම අවශ්‍ය පෝෂණයට වඩා නිරාහාරව සිටීමේ යෙදෙන තෙක් එය සැබෑ ලෙස නිරහාරව සිටීමක් නොවන්නේය.

"....නිරාහාරව සිටීමෙන් මාගේ ආත්මයට පීඩාකරගතිමි...." (ගීතාවලිය 35 : 13)

නිරාහාරව සිටීම නිවැරදි කරනවිට එය දුෂ්කර වන්නේ නැත. නිරාහාරව සිටින විට දෙවියන් වහන්සේ ඔබ වෙනුවෙන් කරන්නේ කුමක්දැයි නිවැරදි තහවුරු කරගන්නේය. ක්‍රියාපටිපාටිය හරිගස්වා ගැනීමට සහ ඒ අනුව ක්‍රියා කිරීමට අයශ්‍යය වන්නාවූ සමාව සම්පූර්ණයෙන්ම ලබාගන්න. යාච්ඤා ජීවිතය සමග නිරාහාරව සිටීම තුල පවතින්න. අපට දෙවියන් වහන්සේ සෑහෙන සේක. නිරාහාරව යාච්ඤා කිරීමෙන් අදහස් කරන්නේ කරුණාව අවසන් වීම මග හරවා ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුන් වහන්සේ වෙතට යොමු වීමයි.

නිරාහාරව යාච්ඤා කිරීම කරුණු කොට ගෙන සාතන්ගේ බලයට විරුද්ධව සටන් කිරීම සඳහා හදවත සහ ආත්මය සන්නද්ධ කර ගන්න. ආත්මය ශක්තිමත්ව භාවිතා කිරීම තුලින් වර්ධනය කරගන්න. යාච්ඤා කිරීම අතපසු කරන්නේ නම් (පැහැර හරින්නේ නම්) ආත්මයේ ජවය. අඩුවන්නේය. නිරහාරව යාච්ඤා කරන්නේ නම් එසේ සිදුවන්නේ නැත. අපි උද්යෝගිමත්ව, සෝදිසියෙන්, ශක්තිමත් ආත්මයක් පවත්වා ගැනීමට නම්, ආත්මය මත පවතින ශක්තියට බලපෑමක් නොවීමට සහ උනන්දුව නසන සමහර කාරණා ප්‍රේතික්ෂේප කල යුතුය. එහිදී සිත මද පවත්වා ගැනීම අවශ්‍ය වේ.

එහිදී හදවතේ ඇති වන්නාවූ ආශාවන් සාධාරණීය කරණය කිරීමේ ප්‍රේතිපලය නම්, ආත්මික ජීවිතයේ උද්යෝගය දුර්වලවීම සහ දෙවියන් වහන්සේගේ කාර්‍යීයන් උදෙසා බොහෝ ඵලදැරීමට සුදුසු නොවීමයි. නිරාහාරව යාච්ඤා කිරීමේ වැදගත්කම තුල සාතන්ගේ බලය පරාජය කර ගැනීම පැහැදිලිවම පෙනෙන්නේය. "ඔවුහු බැටළු පැටවාණන්ගේ ලේ නිසාද, තමුන්ගේ සාක්ෂියේ වචනය නිසාද ඔහුගෙන් ජය ගත්තෝය.ඔවුහු මරණය විඳින තරමටම පවා තමුන්ගේ ජීවිතයට ප්‍රේම නොකර සිටියෝය." (එළිදරව් 12 : 11) අපි අපගේම ජීවිතවලට ප්‍රේම කිරීමෙන් අපගේ ආත්මය දුර්වල වී සටන් කිරීම සඳහා ශක්තිය නැතිවී බෙලහීන වන්නෝය. කැපවීමක් නොමැතිව මහත් වූ ජයග්‍රහණයන් හිමිකරගැනීමට නොහැකිය. අපගේ ආත්මික ශක්තිය මත අධිපත්‍යයෙන් යුතුව සාතන්ගේ අන්ධකාර බලයට විරුද්ධව සටන් කිරීමට මහත් වූ හැකියාව ලබාදී ඒ සඳහා අපව කැඳවන අතර ඕනෑම නුසුදුසු කමක් අපගේ අවසාන ජයග්‍රහණයේ අවස්ථාව හිනකරනවා ඇත. ආත්මික හික්මීම යනුවෙන් අදහස් කර ඇත්තේ කුමක්දැයි අවබෝධ කරගෙන තිබෙන්නේ අපගෙන් ස්වල්ප දෙනෙකි.

"එක්නිසාද දෙවියන් වහන්සේගේ ආත්වයාණන් වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පවණ දෙනෙක් අද්ද එපවණ දෙන දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය." (රෝම 8 : 14)

තමාවම ප්‍රේතික්ෂේප කරමින් ආත්මයාණන් වහන්සේට කීකරු විය යුතුය. (මතෙව් 16 : 24) එමෙන්ම ක්‍රිස්තුන් වහන්සේ සමග ඇති ඒකත්වය පවත්වා ගත යුතුය. නිරාහාරව යාච්ඤා කිරීමේදී තමාව ප්‍රතික්ෂේප කිරීමේ මෙම සත්‍යතාවය මත පිහිටා සිටින අතර එහි ප්‍රතිඵලය වශයෙන් ආත්මික යුද්ධා යුධ පැළඳගෙන සාතන්ගේ සේනාවට විරුද්ධව සිට ජයග්‍රහණයේ ප්‍රතිඵලය ලැබෙන තෙක් ලබාදී තිබෙන්නාවූ ආත්මික ශක්තිය කෙරෙහි ඉවසිල්ලෙන් රඳපැවතීමට හැකිවේ.

පළමු කිතුණු සභාව තමන්ගේ ජීවිතවල ස්වර්ගීය ජෙනරාල්තුමා ලබාදී තිබෙන යුද්ධා යුධ පැළඳගෙන ඔවුන්ගේ ජීවිත ආත්මික සටනේ යෙදෙව්වෝය, සතුරා වන සාතන් සහ පාපය ගැන අවධියෙන් යුතුව තමගේ දේශයට සහ සදාකල ජයග්‍රහණයේ ප්‍රීතිය අත්පත් කර ගැනීමට යාච්ඤා කිරීමේ පැවැතුණෝය. (එපිස 6 : 10 - 18)

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත,
මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.